# වෙළෙඳපොළ නිර්බාධකරණයේ ප්‍රතිඵලයක් ලෙස, මෑතකාලීන චීනයේ ඇති වූ කෘෂිකාර්මික සහ ග්‍රාමීය සංවර්ධනයේ පරිවර්තීය වෙනස්කම් පිළිබඳ විශ්ලේෂණයක්

පී.ඒ. ධර්මරත්න

## සංක්ෂේපය

*පසුගිය දශක කිහිපය තුළ චීන ආර්ථික ක්‍රමය මගින් උපයා ගන්නා ලද ඉහළ ආර්ථික වෘද්ධි අනුපාතයන් හේතු කොටගෙන, චීන ග්‍රාමීය අංශය අතිවිශාල ආර්ථික ජයග්‍රහණයක් කරා මෙහෙයවා ඇති අතර, එමගින් ග්‍රාමීය දරිද්‍රතාවය සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු කර ගෙන ඇත. එසේ වුව ද, ඉදිරි දශකය තුළ මෙම ලබාගත් සමාජ-ආර්ථික ජයග්‍රහණයන්ගේ තිරසාර බව, තවදුරටත් පවත්වාගෙන යෑම ඉතා දුෂ්කර වී ඇත. මක්නිසා ද, ඒ හා බැඳුණු සමාජ, ආර්ථික, දේශපාලන හා ජාත්‍යන්තර තත්ත්වයන්ගෙන් ඇතිවන ක්ෂණික හා කාලීන වෙනස්වීම් හේතු කොටගෙන ය. නව ආර්ථික ප්‍රතිසංස්කරණයන් හඳුනා දුන් අවධියේ දී, සැපයුමේ හිඟකම, ආර්ථික වර්ධනය සඳහා ප්‍රධාන බාධකය වූවත්, වර්තමානයේ ප්‍රධාන බාධකය වී ඇත්තේ දුර්වල ඉල්ලුම යි. තව ද, ඵලදායීතාවය තවදුරටත් වර්ධනය කිරීමේ දී පරිවර්තීය ආර්ථික ප්‍රතිපත්ති සහ ආයතනික සංවිධාන හා ව්‍යුහය මගින් එය සීමා කර ඇත. අනාගත ඵලදායීතාවය තව තවත් වර්ධනය කිරීම සම්පූර්ණයෙන් ම වෙළෙඳපොළ බලවේගයන්ගේ කාර්යක්ෂමතාවය හා උද්‍යෝගීමත් ක්‍රියාකාරී බවත්, ස්වභාවික සම්පත් වන ජලය හා ඉඩම්වල ඵලදායීතාවය වර්ධනය කිරීමත් සහ එමගින් ඇති කරවනු ලබන සම්පත් සංරක්ෂණය හා නව තාක්ෂණික ක්‍රම භාවිතා කිරීමත් යන සියලු කරුණු මත රඳා පැවතී ඇත. ග්‍රාමීය කෘෂිකාර්මික අංශය පූර්ණ වශයෙන්, ශක්තිමත් දැඩි නාගරික අංශයේ කර්මාන්ත මත රඳා පවතින බැවින් එම අංශයේ නව රැකියා උත්පාදනයත් සහ ග්‍රාමීය අංශයේ පවතින අතිරික්ත කෘෂිකාර්මික ශ්‍රමය අවශෝෂණය කරගැනීමත් හේතු කොටගෙන, දැනට කෘෂි ක්ෂේත්‍රයේ නියැලෙන ගොවීන් හට අමතර ඉඩම් ලබා ගැනීමේ හැකියාව වර්ධනය වීමට ඉඩකඩ ලබා දී ඇත. එසේ ම, ග්‍රාමීය අංශය සඳහා ක්‍රියාකාරී හා කාර්යක්ෂම මූල්‍ය ක්‍රමයක් හඳුන්වාදීමත්, ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කළ හැකි ඉඩම් පරිහරණ අයිතීන් පිළිබඳ කළමනාකරණ වැඩසටහනක් හඳුන්වාදීමත්, එම ඉඩම් පරිහරණ අයිතීන්, අලෙවිය සඳහා ඉඩම් වෙළෙඳපොළට ඉදිරිපත් කළ හැකි වීමත් කෘෂිකාර්මික ආයෝජන සඳහා ආකර්ෂණීය දිරි ගැන්වීම් වැඩසටහනක් හඳුන්වා දීමත්, ග්‍රාමීය අංශයේ තෝරාගත් ආයතනික සංවිධාන කීපයක් මගින් ක්‍රියාත්මක කළ යුතු ව ඇත. මෙයට අමතර ව, භාණ්ඩ නිෂ්පාදනය, වෙළෙඳපොළ සහ මිල ප්‍රතිපත්තීන් තවදුරටත් ආර්ථික නිර්බාධීකරණයට ලක්විය යුතු ය. එමෙන් ම, මහජන උපයෝගීතා සේවාවන් සහ පාදක ව්‍යුහමය සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය මූල්‍ය සම්පත් වෙළෙඳපොළ සංවර්ධනය තුළින් ම ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සංවිධානය කළ යුතු ව ඇත.*

## 1. හැඳින්වීම

විසිවන සියවස අගභාගයේ දී චීනය විසින් ඇති කර ගන්නා ලද 'ආර්ථික ප්‍රතිසංස්කරණයන්' සහ එමගින් ඇති වූ සමකාලීන 'සංවර්ධන අත්දැකීම්' සංවර්ධන ආර්ථික විද්‍යා විෂය ක්ෂේත්‍රය තුළ මෑතකාලීන ව බොහෝ සෙයින් 'විවාදශීලී' මෙන් ම 'සංවාදශීලී' විෂය කරුණක් වී ඇත. මේ නිසා ම ඇතැම් අර්ථ ශාස්ත්‍රඥයින් විසින් මෙම චීන ආර්ථික සැලසුම් හා ප්‍රතිපත්තිමය උපාය මාර්ග හැඳින්වූයේ ගලින් ගලට පැන ගඟ තරණය කිරීමේ උපාය මාර්ගික 'විධික්‍රමයක්' ලෙසට ය (Crossing the River by Touching Stones : Ning Wang, 2003). මෙම ආර්ථික සැලසුම්වල තිබූ අවදානම් සහිත බවත්, අවිනිශ්චිතකමත්, නිසා ම මෙවැනි අර්ථයකින් මෙම ආර්ථික ප්‍රතිසංස්කරණ හඳුන්වා දුන් අතර, මේ සඳහා මූලික හේතූන් ලෙස ඔවුන් දක්වා සිටියේ ඇතැම් ආර්ථික ප්‍රතිසංස්කරණ යෝජනා කිසිදු නිශ්චිත ශාස්ත්‍රානුකූල බවක් හෝ විද්‍යානුකූල පදනමකින් තොර ව සැලසුම් කිරීමටත් ඇතැම් ආර්ථික ප්‍රතිසංස්කරණ යෝජනා අවශ්‍යයෙන් ම විවිධ දේශපාලන ආර්ථික කරුණු පදනම් කරගෙන 'බලෙන්' දියත් කළ ඒවා වීමත්, තවත් සමහර ආර්ථික ප්‍රතිසංස්කරණ යෝජනාවන් තුළ අන්තර්ගත වී තිබූ 'පර්යේෂණාත්මක අත්හද බැලීමේ ස්වරූපයත්, ඇතැම් සැලසුම්වල තිබූ දෝෂසහගත ප්‍රවේශයත් යන කරුණු ය. කෙසේ වුව ද, මෙම ආර්ථික සැලසුම් හා ප්‍රතිසංස්කරණ යෝජනාවලින් බහුතරයක් සම්පූර්ණයෙන් ම සාර්ථක වූ අතර, බොහෝ සංවර්ධන සැලසුම් හා යෝජනා නිර්මාණය කරන ලද්දේත්, ඒවා ක්‍රියාත්මක කරන ලද්දේත්, අතිවිශාල 'දේශපාලන-සමාජයීය උද්‍යෝගීමත්භාවයකින් හා උනන්දුවකින් යුතු ව ය. එබැවින් මෙම සංවර්ධන සැලසුම්වල සාර්ථකභාවය සහ ඒවායේ අනෙකුත් සමාජ-ආර්ථික හා දේශපාලන ප්‍රතිවිපාක විශ්ලේෂණය කිරීම මෙම විෂය ක්ෂේත්‍රයේ වැදගත් කාරණයක් වී ඇත (World Bank, 1999. Zhang, 2001. Ninh, 2003 ).

පසුගිය 20 වසරකටත් වඩා වැඩි කාලයක් තුළ චීනය සිය ආර්ථික වෘද්ධි අනුපාතය වාර්ෂික ව සියයට 7කට වඩා වැඩි ප්‍රමාණයකින් වර්ධනය කරගෙන ඇත. එය සංවර්ධනය වෙමින් පවතින බොහෝ රටවල් අතුරින් චීනය ලැබූ විජයග්‍රාහී පියවරක් විය. එසේ ම ලෝක ආර්ථික ඉතිහාසයේ වැදගත් හා අද්විතීය වාර්තාවක් වූ එය සමස්ත ලෝක ආර්ථික වර්ධනයේ සාමාන්‍ය වාර්ෂික වර්ධන වේගය වන සියයට 3 ට වඩා ඉතාමත් ඉහළ අගයක් වී ඇත. මෙවැනි ඉහළ ආර්ථික වර්ධන වේගයක් ලොව කිසිදු සංවර්ධනය වෙමින් පවතින රටකින් මෙතෙක් වාර්තා වී නැත. චීනය ලබාගත් අනෙකුත් ආර්ථික ජයග්‍රහණයන් අතර 'ආහාර නිෂ්පාදනයේ ස්වයංපෝෂිතභාවය' ඉතා වැදගත් වේ. මේ අනුව චීනය සතු ව පවතින වගා කළ හැකි කෘෂිකාර්මික වගා බිම් ප්‍රමාණය ලෝකයේ සමස්ත මුළු වගා කළ හැකි වගා බිම් ප්‍රමාණයෙන් සියයට 10ක් පමණ වන අතර, එම බිම් ප්‍රමාණය උපරිම වගා කටයුතුවලට යෙදූ චීනය, ලෝක ජනගහනයෙන් සියයට 22 කට වඩා වැඩි ජන කොටසකට ආහාර සපයමින් තම ජනතාවගේ ආහාර සුරක්ෂිතභාවය ආරක්ෂා කොට සහතික කර ඇත (FAO, 1995). මෙම ආර්ථික ප්‍රතිසංස්කරණය මුල් කරගෙන ග්‍රාමීය-නාගරික දරිද්‍රතාවය අඩු කිරීමෙන් ද චීනය විශිෂ්ට පියවරක් තබා ඇත.

මෙම ලිපියේ මූලික අභිමතාර්ථය වන්නේ, චීනය විසින් ලබා ගන්නා ලද මෙම සංවර්ධනය ක්‍රියාදමයේ ස්වරූපය හා ක්‍රියාකාරීත්වය කෙසේ ද යන්න විමර්ශනය කරදක්වීම ය. ඊට අමතර ව පහත සඳහන් විශේෂිත අරමුණු කීපයක් ද මෙම ලිපිය රචනා කිරීමේ පරමාර්ථයන් ලෙස දැක්විය හැකි ය.

1. චීන ආර්ථික ක්‍රමයේ කෘෂිකාර්මික හා ග්‍රාමීය සංවර්ධන ක්‍රියාවලිය තුළ අන්තර්ගත වී ඇති සුවිශේෂතාවයන් හා ඒ ආශ්‍රිත ගැටළු නිරීක්ෂණය කිරීම.

2. චීනය මධ්‍යගත සැලසුම් ආර්ථික ක්‍රමයක සිට වෙළෙඳපොළ පදනම් කරගත් ආර්ථික ක්‍රමයට පරිවර්තනය වීමේ දී සංවර්ධන ක්‍රියාවලිය තුළ තිබූ තත්ත්වයන් විමර්ශනය කිරීම.

3. සංවර්ධිත උපාය මාර්ගයන් සකස් කරගැනීමේ දී චීනය විසින් භාවිත කරන ලද ආර්ථික සංවර්ධන ප්‍රතිපත්ති සහ (ඒ ආශ්‍රිත භාවිතා කරන ලද) සංවර්ධන ක්‍රමෝපායන් හඳුනා ගැනීම.

## 2. චීනයේ කෘෂිකාර්මික සහ ග්‍රාම සංවර්ධනයේ ඓතිහාසික පසුබිම

වර්ෂ 1949 වන තෙක් ම, දේපළ පිළිබඳ පුද්ගල අයිතිය පෞද්ගලික දේපළ හා ව්‍යාපාර පරිපාලනය හා එහි ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් ලෝකයේ අනෙකුත් සංවර්ධනය වෙමින් පැවැති රටවල පැවති තත්ත්වය හා චීනයේ තත්ත්වය අතර කිසිදු වෙනසක් දක්නට නොවීය. කෙසේ වුව ද, සමාජ-ආර්ථික විෂමතාවයන් නිසා සම්පත් ලබා ගැනීමේ හැකියාව පිළිබඳ වෙනස්කම් රාශියක් සමාජය පුරා පැතිරී තිබිණි. දීර්ඝ කාලයකට පසුව, 1949 දී 'මහජන චීන සමූහාණ්ඩුව' පිහිටුවීමත් සමගම, චීනය සිය ආර්ථික සංවර්ධන උපාය මාර්ගයන් සඳහා 'සෝවියට් සංවර්ධන ආකෘතිය' නැතහොත් අනුරූපය අනුගමනය කිරීමට පටන් ගත් අතර, එය අදියර කීපයක් යටතේ සිදුවිය. වර්ෂ 1950 ගණන්වල මුල් භාගයේ දී ඇති කරන ලද 'විප්ලවීය කෘෂිකාර්මික ප්‍රතිසංස්කරණය' මගින් ග්‍රාමීය, දරිද්‍රතාවයෙන් පෙළෙන ජන කොටස්වලින් සියයට 80 කටත් වඩා ප්‍රමාණයකට කෘෂිකාර්මික ඉඩම් ලබා ගැනීමේ හැකියාව වර්ධනය කර දී තිබුණි. එසේ ම ඉඩම් ප්‍රතිසංස්කරණය යටතේ නැවත බෙද හරිනු ලැබූ ඉඩම් එතෙක් පරිහරණය කරනු ලැබුවේ, ජනගහනයෙන් සියයට 20 කටත් වඩා අඩුවෙන් සිටි ධනපති ඉඩම් හිමියන් විසිනි (Zhang, 2000). එතෙක් ග්‍රාමීය චීනයේ, කෘෂිකාර්මික නිෂ්පාදන කටයුතු කරගෙන යනු ලැබුවේ ස්වයං අයිතීන් යටතේ, එක් එක් ගොවියා විසින් පෞද්ගලිකව ය (Harold, 1979).

'සාමූහික ව්‍යාපාර සංවිධාන' (collective movements) යන සාමූහික සමූපකාර ක්‍රමය, 1950 ගණන්වල දී චීන කොමියුනිස්ට් විප්ලවයේ ප්‍රතිඵලයක් ලෙස ආරම්භ විය. මෙම ක්‍රමය ආරම්භ කිරීමේ දී මූලික තර්කයක් ලෙසට ගෙන හැර දක්වූයේ

නිරන්තරයෙන් විවිධාකාරයේ ස්වභාවික ආපදාවන්වලට මෙන් ම සමාජ-ආර්ථික හැල හැප්පීම්වලට ගොදුරුවන කුඩා පරිමාණ සුළු ගොවීන් සහ පෞද්ගලික ගෘහස්ථ කර්මාන්ත ඒකකයන් එම ගැටළුවලින් ආරක්ෂා කරගැනීමට මේ මගින් ඇති හැකියාව යි. එබැවින් මෙම සාමූහික නිෂ්පාදන කළමනාකරණ ක්‍රමය ඉහත දක්වූ දුර්වල තත්ත්වයන්ගෙන් මහහැරීම සඳහා යම් ප්‍රමාණයකින් දයක වී ඇත. තව ද මෙහි ආරම්භක අදහස වූයේ නිෂ්පාදනයේ දී සමුපකාර සේවාවන් අනුගමනය කිරීමත්, ඒ සඳහා කුඩා ගෘහස්ථ කර්මාන්ත ඒකකයන්ට විවිධ කෘෂි නිෂ්පාදන අවස්ථාවන්වල දී අන්‍යෝන්‍ය වශයෙන් ආධාර-උපකාර කරගැනීමට ඉඩකඩ සැලැසීමත් ය. මෙම ආකාරයේ විවිධ වැඩපිළිවෙළ සහ සංවිධානාත්මක කටයුතු නම් කරනු ලැබුවේ 'ශ්‍රම හුවමාරුවක්' (labour exchange) ලෙසට ය.

සාමූහික නිෂ්පාදන සංවිධාන ක්‍රමයේ දෙවන අදියර මගින් වඩාත් අවධාරණය කරනු ලැබුවේ, විශාල හා මධ්‍ය පරිමාණයේ ගොවිපළ නිෂ්පාදන මධ්‍යස්ථානයන් ය. කෙසේ වුව ද ඉතා කෙටි කාලයක් තුළ දී ම, මහා පරිමාණයේ නිෂ්පාදන මධ්‍යස්ථානයන්, ග්‍රාමීය ප්‍රදේශවල සුලභ වන්නට විය. ඒ අනුව සියලු ම පෞද්ගලික ගෘහස්ථ ඒකකයන්ගේ අයිතීන් මත තිබූ ඉඩම්, සාමූහික අයිතිය මත ඇති ඉඩම් බවට පරිවර්තනය විය. එහෙයින් 'නිෂ්පාදන මාධ්‍යය' (means of production) පූර්ණ වශයෙන් සාමූහිකරණයක් ලෙසට ක්‍රියාත්මක විය. මෙම ක්‍රමය තුළ නිෂ්පාදන ක්‍රියාවලිය මෙහෙයවීම සඳහා සාමූහික නිෂ්පාදන කණ්ඩායම් ක්‍රමය (commune system) පිහිටවනු ලැබීය. එහි දී නිෂ්පාදන කණ්ඩායම් (production team) කුඩා ම නිෂ්පාදන ඒකකයන් වූ අතර, එවැනි ඒකක රාශියක් එක් වී නිෂ්පාදන කණ්ඩායම (production brigade) ඇති විය. මේ අනුව නිෂ්පාදන කණ්ඩායමක් ක්ෂේත්‍ර මට්ටමේ ක්‍රියාකාරී නිෂ්පාදන බලවේගයන් මෙහෙයවීමේ ක්‍රියාකාරී සංවිධානයක් ලෙස දිගු කාලයක් ක්‍රියාත්මක විය. මෙම නිෂ්පාදන සංවිධාන ක්‍රමය, 1970 දශකයේ අග භාගයේ දී හඳුන්වා දුන් නව ආර්ථික ප්‍රතිසංස්කරණයන් ක්‍රියාත්මක වන තුරු වසර 30 කටත් අධික කාලයක් ක්‍රියාත්මක විය (Qiwen, 1979. Baker and Sinha 1982 ). එසේ වුවත්, ග්‍රාමීය ප්‍රදේශවල ආයතනික සංවිධාන රටාවන්ගේ සුවිශේෂ වෙනසක් සිදු නොවූ අතර, ප්‍රධාන වෙනස්කම් ඇති වූයේ 'කෘෂිකාර්මික ප්‍රතිපත්ති' සහ ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම්වල ය. පහත වගුව මගින් සාරාංශ කරනුයේ ආර්ථික ප්‍රතිසංස්කරණයන්ට ප්‍රථම පැවති ප්‍රධාන දේශපාලන ක්‍රියාකාරීත්වයේ සංසිද්ධීන් සහ පරිවර්තීය කෘෂිකාර්මික වෙනස්වීම්වල පැවති සම්බන්ධතාවය යි.

වගුව 1

## විතයේ ප්‍රධාන දේශපාලන සංසිද්ධීන් සහ කෘෂිකාර්මික ප්‍රතිපත්තිවල වෙනස්වීම් - 1949 සිට

| කාල පරිච්ඡේදය | දේශපාලන සංසිද්ධිය | ප්‍රධාන කෘෂිකාර්මික ප්‍රතිපත්තීන්ගේ ඇති වූ පරිවර්තීය වෙනස්කම් |
|---|---|---|
| 1949 - 1952 | සමාජවාදී ඉඩම් ප්‍රතිසංස්කරණය සහ කෘෂිකාර්මික නවීකරණය | විශේෂිත කෘෂි නිෂ්පාදන ක්‍රම ඇති කිරීම. |
| 1953 - 1957 | සමූපකාර ව්‍යාපාරය | නිදහස් වෙළෙඳපොළ සඳහා යම් යම් අවකාශ හා ඉඩකඩ ලබාදීම. |
| 1958 - 1962 | හරිත නිෂ්පාදන පෙරමුණ | ඉල්ලුම හා සැපයුම පිළිබඳ අනිවාර්ය පාලනයක් (great leaf forward movement) ඇති කිරීම. <br> නිදහස් වෙළෙඳපොළ පාලනය, ප්‍රධාන ධාන්‍ය නිෂ්පාදනය සම්බන්ධයෙන් ස්වයංපෝෂිත තත්ත්වයක් ඇති කිරීම. |
| 1963 - 1965 | කෘෂිකාර්මික ප්‍රතිපත්තීන් නැවත සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම (re-adjustment period) | කෘෂි නිෂ්පාදන සඳහා ඉතාමත් අඩු මට්ටමේ මිලක් ලබා දීම. (කොමියුන) සාමූහික නිෂ්පාදන ක්‍රමය ක්‍රියාත්මක වීම. <br> මෙම කාලයේ (1963-1965) කෘෂි ප්‍රතිපත්ති, ප්‍රතිසංස්කරණවලට පෙර පැවති ප්‍රතිපත්තීවලට සමාන විය. |
| 1966 - 1978 | සංස්කෘතික විප්ලවය | කෘෂිකාර්මික, ආර්ථික හා සමාජ පසුගාමීත්වයක් ඇතිවීම. |
| 1979 සිට | නව ආර්ථික ප්‍රතිසංස්කරණ හඳුන්වාදීම | කෘෂි නිෂ්පාදන සඳහා සාපේක්ෂ ව ප්‍රතිසංස්කරණයන් හඳුන්වා දීම, අධික මිලක් ලැබීම. <br> නිදහස් වෙළෙඳපොළ බලවේගයන් ධෛර්යමත් කිරීම, විශේෂිත නිෂ්පාදනයන් වර්ධනය කිරීම හා දියුණු කිරීම, සාමූහික නිෂ්පාදන ක්‍රමය අවලංගු කිරීම, විවිධාකාරයේ නිෂ්පාදන වගකීම් ක්‍රම හඳුන්වාදීම. |

1970 දශකයේ අග භාගයේ නව ආර්ථික ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය ආරම්භ වූ අතර එහි මූලික ක්‍රියාකාරකම් වූයේ පහත සඳහන් කටයුතු ය.

1. පෞද්ගලික හා ගෘහස්ථ වගකීම් සහිත නිෂ්පාදන ක්‍රමයන් හඳුන්වාදීම හා ව්‍යාප්ත කිරීම.


2. රජය වෙළෙඳපොළ පාලනයෙන් ඉවත් වී නිදහස් වෙළෙඳපොළ ක්‍රමය හඳුන්වා දී කෘෂි නිෂ්පාදන මිල ගණන් ඉතා විශාල ලෙස වැඩි කිරීම.

3. ග්‍රාමීය අංශයේ පැවති ගොවිපොළ නො වන ආර්ථික කටයුතු සහ අනෙකුත් ව්‍යාපාරික කටයුතු ධෛර්යමත් කර වැඩි දියුණු කිරීමත්, ප්‍රදේශීය, ග්‍රාමීය හා නාගරික වශයෙන් ඒකරාශී වී පැවති ශ්‍රම බලකාය විධිමත් ලෙස විසිරවීම හා ඒකරාශී කිරීම සඳහා සංවිධාන කටයුතු කිරීමත් ය.

මේ අනුව, චීනයේ පැවති මධ්‍ය සැලසුම් සහිත ආර්ථික ක්‍රමය වෙළෙඳපොළ මූල්කරගත් ක්‍රමයක් දෙසට නැඹුරු වෙමින් වඩාත් 'විවෘත ආර්ථික' ක්‍රමයක් කරා දිසාභිමුඛ විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස චීන ආර්ථික ක්‍රමයේ සුවිශේෂ වර්ධනයක් හා සංවර්ධනයක් ඇති විය. ඒ බව පහත දක්වෙන වගුව 2 හා රූපසටහන 1 මගින් දක්වා ඇත.

**රූපසටහන 1**

**ආර්ථිකයේ ඇති වූ ව්‍යුහමය වෙනස්කම්**
**(දළ ජාතික නිෂ්පාදිතයේ ප්‍රතිශත ලෙස)**




මූලාශ්‍රය : *Agricultural and Rural Development in China, (2003). Centre for Chinese Agricultural Policy, Chinese Academy of Sciences.*

වගුව 2

**චීන ආර්ථිකයේ විවිධ අංශයන් හි වාර්ෂික වර්ධන වේගයන් (ප්‍රතිශතවලින්)**

| ආර්ථිකයේ විවිධ අංශ | ප්‍රතිසංස්කරණයට පෙර | ප්‍රතිසංස්කරණ කාලය හා ඊට පසු | | |
|---|---|---|---|---|
| | 1970-78 | 1979-84 | 1985-95 | 1996-2000 |
| දළ දේශීය නිෂ්පාදනය (GDP) | 4.8 | 8.5 | 9.7 | 8.2 |
| කෘෂිකර්මය | 2.7 | 7.1 | 4.0 | 3.4 |
| කර්මාන්ත | 6.8 | 8.2 | 12.8 | 9.6 |
| සේවා | ලැ.නො. | 11.6 | 9.7 | 8.2 |
| විදේශීය වෙළෙඳම | 20.5 | 14.3 | 15.2 | 9.8 |
| ආනයන | 21.7 | 12.7 | 13.4 | 9.5 |
| අපනයන | 19.4 | 15.9 | 17.2 | 10.0 |
| ධාන්‍ය නිෂ්පාදනය | 2.8 | 4.7 | 1.7 | 0.03 |
| තෙල් භෝග නිෂ්පාදනය | 2.1 | 14.9 | 4.4 | 5.6 |
| පලතුරු නිෂ්පාදනය | 6.6 | 7.2 | 12.7 | 8.6 |
| සත්ව නිෂ්පාදනය (මස්) | 4.4 | 9.1 | 8.8 | 6.5 |
| ධීවර නිෂ්පාදනය | 5.0 | 7.8 | 13.7 | 10.2 |
| ග්‍රාමීය කර්මාන්තවල නිෂ්පාදන වටිනාකම | ලැ.නො. | 12.3 | 24.1 | 14.0 |
| ජනගහනය | 1.80 | 1.40 | 1.37 | 0.90 |
| ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදනය | 3.1 | 7.1 | 8.3 | 7.1 |

*ලැ.නො. : ලැබී නොමැති දත්ත*

*මූලාශ්‍රය : චීන කෘෂිකාර්මික ප්‍රතිපත්ති අධ්‍යයනය සඳහා වූ මධ්‍යස්ථානය. 1970/2000.*

සමස්ත ආර්ථික ක්‍රමය තුළ මෙවැනි සුවිශේෂ වෙනස්වීම් ඇති වුවද, කෘෂිකාර්මික අංශය තුළ පවතින මූලික ලක්ෂණ හා ඇතැම් අංශවල එතරම් කැපී පෙනෙන වෙනස්වීමක් සිදු නොවීය. උදහරණයක් ලෙස සියලුම ගොවීන් කුඩා පරිමාණ ගෘහස්ථ නිෂ්පාදන ඒකකයන්ගෙන් සමන්විත නිෂ්පාදන ක්‍රියාදමයකට අනුබද්ධ විය. චීන කෘෂිකර්මයේ ඇති අංග ලක්ෂණය ලෙසත්, වඩාත්ම වැදගත් ව්‍යුහාත්මක වෙනස්කම් ලෙසත්, මෙහිදී ගෙන හැර දක්විය හැක්කේ 'වගා කළ හැකි' ඉඩම් වඩාත් සාධාරණ ව්‍යාප්තියක් ඇතිවන ලෙසින් ගෘහස්ථ ඒකක අතර බෙදී යෑම යි. මෙය සංවර්ධනය වූ රටවල සහ සංවර්ධනය වෙමින් පැවති රටවල් හා චීනයත් අතර ඇතිව තිබූ සුවිශේෂ වෙනස්කමක් ලෙසට පෙන්වා දිය හැකිය (Short, P. 1982). මෙම ඉඩම් භුක්ති ක්‍රමය ග්‍රාමීය ගෘහස්ථ ඒකකයන් සඳහා ප්‍රධාන ජීවන මාර්ගයන් සපයා දුන් අතර, ග්‍රාමීය ප්‍රදේශවලට අවශ්‍ය සුබසාධන හා රක්ෂණ ක්‍රම සඳහා අවශ්‍ය ආදේශක සේවාවන් ද ලබා දුන්හ. කෙසේ වුව ද මෙම වැඩසටහන


මගින් ඇති කරන ලද ක්‍රියාකාරීත්වයන් විසින් 'නිෂ්පාදන කාර්යක්ෂමතාවය' වඩාත් අඩු කරන ලද බැවින් එය ග්‍රාමීය සුබසාධන කටයුතුවල මෙන් ම සමාජ ස්ථාවරත්වය කෙරේ තදින් බලපාන ලද ප්‍රධාන සාධකයක් විය.

## 3. ආර්ථික ප්‍රතිසංස්කරණ හමුවේ චීන කෘෂිකර්මයේ වෙනස් වීම්

නව ආර්ථික ප්‍රතිසංස්කරණ සමග ම චීන ආර්ථිකය සුවිශේෂ වර්ධනයක් හිමි කරගෙන තිබිණි. උදහරණයක් ලෙසට, 1979 - 1984 අතර කාලයේ දී අත්කරගත් වාර්ෂික දළ දේශීය නිෂ්පාදනයේ වර්ධන වේගය සියයට 8.5 ක් වූ අතර, 1985-1997 අතර කාලයේ දී එම වර්ධන වේගය සියයට 9.7 ක් පමණ විය (Huang, *et al*, 2001) (වගුව 2 හා රූපසටහන 2). මෙම කාලයේ දී 'ආසියානු මූල්‍ය අර්බුදය' ඉතා දැඩි ලෙස කලාපීය රටවල් කෙරේ බලපෑම් කළ ද, චීනය එම කාලයේ දී ද විශේෂිත ආර්ථික වර්ධන වේගයක් අත් කර ගත්තේ ය. ඒ අනුව, 1996-2000 අතර කාලයේ දී චීනය අත් කර ගත් ආර්ථික වර්ධනය සියයට 8.2 ක් විය. නව ආර්ථික ප්‍රතිපත්තිවල තවත් එක් සුවිශේෂ ප්‍රතිඵලයක් වූයේ, 'චීනයේ විදේශීය වෙළෙඳම' ඉතා සීඝ්‍රයෙන් සංවර්ධනය වී ව්‍යාප්ත වීම යි. 1980 වන විට චීනයේ ජාත්‍යන්තර වෙළෙඳම එහි දළ දේශීය නිෂ්පාදනයේ සියයට 13 ක ප්‍රතිශතයක් ලෙස පැවතිණි. වර්ෂ 2000 වන විට එය සියයට 44 ක ප්‍රතිශතයක් දක්වා වර්ධනය වී ඇත (Zhigang, 1996). කෙසේ වුව ද 1980 පමණ විට ආර්ථිකය ප්‍රතිසංස්කරණයන්ගේ බලපෑම මුළු සමස්ත ආර්ථිකය පුරා ම විහිද ගොස් තිබිණි. ඉතාමත් සාර්ථක හා යෝග්‍ය ආර්ථික වෙනස්වීම් හා විපර්යාසයන් මුළුමණින් ම පාහේ කෘෂිකාර්මික අංශයේ ක්‍රියාකාරීත්වය මත රඳා පැවතිණි. 1984 දක්වා කාලයේ දී ධාන්‍ය නිෂ්පාදනය සියයට 4.7 කින් වර්ධනය විය. පලතුරු හා අනෙකුත් කෘෂි නිෂ්පාදන අංශයන් ද, ධීවර හා සත්ව පාලන නිෂ්පාදන අංශයන් ද වේගයෙන් වර්ධනය විණි (වගුව 2 හා රූපසටහන 2). එසේ වුව ද 1985 න් පසු කෘෂි නිෂ්පාදන අංශයේ වර්ධන වේගය යම්තාක් දුරට අඩු වීම සහ කාර්යක්ෂමතාවය හීනවී යෑමත්, සාමූහික නිෂ්පාදන ක්‍රමය බිඳ වැටීමේ ප්‍රතිඵලයක් ලෙසට දක්විය හැකි වුව ද 'කෘෂිකාර්මික අංශයේ ඇති වූ සුවිශේෂ වර්ධන හැකියාව හා ප්‍රවණතාවය එලෙසින් ම සතුටුදායක මට්ටමක පවත්වාගෙන යෑමට චීනයට හැකි විය. මෙම වර්ධනය වඩාත් වැදගත් වූයේ හීන වෙමින් පැවති ජනගහන වර්ධනය හමුවේ කෘෂිකාර්මික වර්ධනයේ නැගී සිටීම හා එහි කැපී පෙනීම හේතු කොටගෙන ය (Yongding, 2001).

## රූපසටහන 2


### දළ දේශීය නිෂ්පාදිතය සහ සමස්ත දළ දේශීය නිෂ්පාදන වර්ධනය (ප්‍රතිශත ලෙස)




මූලාශ්‍රය : *Agricultural and Rural Development in China, (2003). Centre for Chinese Agricultural Policy, Chinese Academy of Sciences.*

## රූපසටහන 3

### කෘෂිකාර්මික අංශයේ වර්ධනය (ප්‍රතිශත ලෙස)




මූලාශ්‍රය : *Agricultural and Rural Development in China, (2003). Centre for Chinese Agricultural Policy, Chinese Academy of Sciences.*

ආර්ථික ප්‍රතිසංස්කරණයෙන් පසු ව චීන ආර්ථික ක්‍රමයේ සිදු වූ විශේෂිත ලක්ෂණය නම්, පරිවර්ථීය විපර්යාසයන් ය. එමගින් සිදු වූ මූලික කාර්යභාරය වූයේ, ග්‍රාමීය ආර්ථිකය නාගරික ආර්ථිකයක් කරා පරිවර්තනය වීම නැතහොත් කෘෂිකාර්මික ආර්ථික ක්‍රමය කර්මාන්ත පදනම් කරගත් ආර්ථික ක්‍රමයක් බවට පරිවර්තනය කිරීම යි. මෙම ක්‍රියාවලිය තුළ දී, ජාතික ආර්ථිකය තුළ කෘෂිකර්මයේ දායකත්වය සැලකිය යුතු ලෙසින් අඩු වී ඇත (Yongding, 2001) (වගුව 3 හා රූපසටහන 2).

වගුව 3

**චීන ආර්ථික ව්‍යුහයේ ඇති වූ ව්‍යුහාත්මක වෙනස්වීම් (ප්‍රතිශත ලෙස)**

| ආර්ථික අංශයන් | 1970 | 1980 | 1985 | 1990 | 1995 | 2000 |
|---|---|---|---|---|---|---|
| දළ දේශීය නිෂ්පාදනයේ සංයුතිය | | | | | | |
| කෘෂිකර්මය | 40 | 30 | 28 | 27 | 20 | 16 |
| කර්මාන්ත | 46 | 49 | 43 | 42 | 49 | 51 |
| සේවා | 13 | 21 | 29 | 31 | 31 | 33 |
| සේවා නියුක්තියේ සංයුතිය | | | | | | |
| කෘෂිකර්මය | 81 | 69 | 62 | 60 | 52 | 50 |
| කර්මාන්ත | 10 | 18 | 21 | 21 | 23 | 22.5 |
| සේවා | 09 | 13 | 17 | 19 | 25 | 27.5 |
| ආනයන සංයුතිය | | | | | | |
| මූලික නිෂ්පාදන | ලැ.නො | 50 | 51 | 26 | 14 | 10 |
| ආහාර | ලැ.නො | 17 | 14 | 11 | 07 | 05 |
| අපනයන සංයුතිය | | | | | | |
| මූලික නිෂ්පාදන | ලැ.නො | 35 | 13 | 19 | 18 | 21 |
| ආහාර | ලැ.නො | 15 | 04 | 06 | 05 | 02 |
| කෘෂි නිෂ්පාදනවල සංයුතිය | | | | | | |
| භෝග නිෂ්පාදනය | 82 | 76 | 69 | 65 | 58 | 56 |
| සත්ව නිෂ්පාදනය | 14 | 18 | 22 | 26 | 30 | 30 |
| ධීවර නිෂ්පාදනය | 02 | 02 | 03 | 05 | 08 | 11 |
| වනාන්තර | 02 | 04 | 05 | 04 | 03 | 04 |
| ග්‍රාමීය ජනගහනයේ ප්‍රතිශත වෙනස්වීම් | 83 | 81 | 76 | 74 | 71 | 64 |

ලැ.නො. (ලැබී නොමැති දත්ත)

මූලාශ්‍රය : *Adapted from Centre for Chinese Agricultural Policy Working Paper, (2001).*

වේගවත් ආර්ථික වර්ධනය සහ අධිවේගී නාගරීකරණය හේතු කොටගෙන ආහාර වෙළෙඳපොළ තුළ විශාල පිබිදීමක් ඇති විය. විශේෂයෙන් ම මස් වර්ග, පලතුරු සහ අනෙකුත් ප්‍රධාන නො වන ආහාර වර්ග සඳහා විශාල ඉල්ලුමක් වෙළෙඳපොළේ ජනිත වූ අතර, එමගින් කෘෂිකාර්මික ව්‍යුහයේ සැලකිය යුතු වෙනසක් ඇති විය. උදහරණයක් ලෙසට සත්ව පාලනයේ දයකත්වය ඉතාමත් සතුටුදයක තත්ත්වයකට පත් විය. 1970 දී මුළු කෘෂි නිෂ්පාදන වටිනාකමින් සියයට 14 ක් වූ සත්ව පාලන කටයුතු වර්ෂ 2000 දී සියයට 30 දක්වා දෙගුණයකින් වර්ධනය වී ඇත (වගුව 3). ධීවර නිෂ්පාදනවල ද එවැනි ම සුවිශේෂ වර්ධනයක් දක්නට ලැබුණි. කෘෂිකර්මයේ ඇති වූ ව්‍යුහාත්මක වෙනස්කම් තුළ වඩාත් ම කැපී පෙනෙන ලක්ෂණය වූයේ, මුළු කෘෂි නිෂ්පාදන ධාරිතාවයට එකතුවන භෝග නිෂ්පාදන ප්‍රමාණයන්ගේ දයකත්වය සියයට 82 සිට සියයට 56 දක්වා පහත වැටීම ය (World Bank, 1999. Wang, *et al*, 2001). තව ද ධාන්‍ය නිෂ්පාදන අංශයේ විවිධ භෝග නිෂ්පාදනවල වර්ධන වේගය මෙම පහත වැටීමේ සීඝ්‍රතාවය වඩාත් කැපී පෙනෙන ලෙස ඉස්මතු කර දක්වා ඇත (වගුව 2 සහ රූපසටහන 2).


කෘෂිකාර්මික අංශයේ කලින් සිටි ශ්‍රම හමුදව කෘෂිකාර්මික නො වන අංශයන් කරා දිගින් දිගටම සංක්‍රමණය වී ඇත. මේ සඳහා කෘෂිකාර්මික නො වන අංශයේ දයකත්වය අඛණ්ඩ ව ක්‍රියාකාරී වී ඇත.

## 4. මෑතකාලීන සංවර්ධන ජයග්‍රහණයන් හා වර්ධන උපනතීන්

චීනය වසර විස්සකට වැඩි කාලයක් අඛණ්ඩ ව ආර්ථික වර්ධන වේගය සියයට 8-10ත් අතර ප්‍රමාණයකින් පවත්වාගෙන ගොස් ඇත. එය ලොව කිසිදු සංවර්ධනය වූ හෝ නොවූ රටක් අත් කර නො ගත් ආර්ථික ජයග්‍රහණයකි. එය ජනතාවගේ ජීවන තත්ත්වය ඉතා සුබදයී තත්ත්වයකට පත් කරනු ලැබීය. ග්‍රාමීය අංශයේ ඒක පුද්ගල ආදයම මගින් මෙය පෙන්නුම් කරයි (රූපසටහන 5). 1978 වන විට ග්‍රාමීය අංශයේ අයෙකුගේ සාමාන්‍ය ඒක පුද්ගල ආදයම ලෙස වාර්තා වී තිබුණේ යුවාන් 220 ක් (RMB) හෝ ඇමරිකානු ඩොලර් 150 කට සමාන මුදලකි. 1949 සිට 1978 දක්වා වසර 29 ක කාලයක් තුළ මෙය වර්ධනය වූයේ සියයට 2.3 ක පමණ වාර්ෂික වේගයකිනි. විශ්මයජනක වෙනස්වීම් ඇති වූයේ 1978 දී සිදු කරන ලද ග්‍රාමීය නව ආර්ථික ප්‍රතිසංස්කරණයන් සමඟ ය. 1984 වන විට ඒක පුද්ගල ආදයම යුවාන් 522 ක් දක්වා සියයට 15 ක වේගයකින් වර්ධනය වී ඇත. 1980 දශකයේ මැද භාගය තෙක් ග්‍රාමීය ආදයම අඛණ්ඩ ව වැඩි වී තිබුණ ද ඉන්පසු වැඩි වූයේ මඳ වේගයකිනි. මෙම කාලයේ දී ආදයම් වර්ධන වේගය සියයට 3ක් පමණ විය. මේ සඳහා මූලික හේතුව වූයේ කෘෂිකාර්මික නිෂ්පාදනවල සැලකිය යුතු වර්ධනයක් ඇති නො වීම ය. මේ අතර ග්‍රාමීය ආදයම් ලබන්නන්ගේ ගොවිපොළ නො වන ආදයම් වර්ධනය 1990 දී පමණ ආරම්භ වී, එම දශකය පුරා දිගින් දිගට ම වර්ධනය වීමක් දක්නට ඇත (Huang, 1996).

රූපසටහන 4


**වර්තමානයේ ව්‍යුහාත්මක වෙනස්වීම් සමඟ සමගාමී ව සිදු වූ සේවා නියුක්ති සංයුතියේ වෙනස්වීම්**




මූලාශ්‍රය : *Agricultural and Rural Development in China, (2003). Centre for Chinese Agricultural Policy, Chinese Academy of Sciences.*

රූපසටහන 5

**ග්‍රාමීය අංශයේ ඒක පුද්ගල ආදායම් මට්ටම්වල වෙනස් වීම්**





මූලාශ්‍රය : *Agricultural and Rural Development in China, (2003). Centre for Chinese Agricultural Policy, Chinese Academy of Sciences.*

මෙලෙස චීනය තම ග්‍රාමීය දරිද්‍රතාවය අඩු කිරීම විදේශ රටවල් ද, ජාත්‍යන්තර සංවර්ධන ආයතන ද, වෙනත් ජාත්‍යන්තර ආධාර සංවිධානයන් ද පොදුවේ පිළිගෙන ඇත. විශේෂයෙන් ම සංඛ්‍යාත්මක වශයෙන් දුප්පතුන්ගේ සංඛ්‍යාව මෙම කාලය තුළ දී විශාල ලෙස අඩු කරන ලදී (රූපසටහන 6). චීනයේ 'නිල දරිද්‍රතා මට්ටම' අනුව ග්‍රාමීය දුප්පතුන්ගේ සංඛ්‍යාව පසුගිය වසර 20 ක කාලය තුළ සුවිශේෂ ලෙස අඩු වී ඇත. 1978 දී දශ ලක්ෂ 260 ක් වූ දුප්පතුන්ගේ සංඛ්‍යාව 1984 වන විට දශ ලක්ෂ 128 දක්වා අඩු වී ඇත. 1990 ගණන්වල දී තවදුරටත් අඩු වීමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කර ඇත. 1998 දී දශ ලක්ෂ 42 ක් වූ දරිද්‍රතාවයෙන් පෙළෙන ජන සංඛ්‍යාව 2000 වසර වන විට දශ ලක්ෂ 30ක් දක්වා අඩු වී තිබිණි. 1978 දී මුළු ජන සංඛ්‍යාවෙන් සියයට 32.9 ක් දරිද්‍රතාවයෙන් පෙළුණු අතර, 1984 දී එම දරිද්‍රතාවයේ ප්‍රමාණය සියයට 15 දක්වා ද, 2000 වන විට සියයට 3 දක්වා ද සැලකිය යුතු මට්ටමකින් අඩු වී තිබිණි (Government of China, 2002).

**රූපසටහන 6**


**ග්‍රාමීය දරිද්‍රතාවයෙන් පෙළෙන ජන සංඛ්‍යාව, ග්‍රාමීය ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස (ව්‍යාප්ති ප්‍රදේශ)**




මූලාශ්‍රය : *Agricultural and Rural Development in China, (2003). Centre for Chinese Agricultural Policy, Chinese Academy of Sciences.*

## රූපසටහන 7


### ග්‍රාමීය දුප්පතුන්ගේ ප්‍රමාණය (ප්‍රතිශතයක් ලෙස)




මූලාශ්‍රය : *Agricultural and Rural Development in China, (2003). Centre for Chinese Agricultural Policy, Chinese Academy of Sciences.*

## රූපසටහන 8

### ඒක පුද්ගල ඉඩම් පරිභෝජනය වසර 1995 සහ වසර 2030 දී (පුරෝකථනය කරන ලද)




මූලාශ්‍රය : *Agricultural and Rural Development in China, (2003). Centre for Chinese Agricultural Policy, Chinese Academy of Sciences.*

පසුගිය දශක කීපයක් මුළුල්ලේ ම, චීනය සිය කෘෂිකාර්මික හා ග්‍රාමීය කර්මාන්ත අංශයේ සුවිශේෂ වර්ධනයට සමගාමී ව ආකර්ෂණීය ලෙස සිය ග්‍රාමීය දරිද්‍රතාවය ද අඩු කර ගත්ත ද එයට අනුලෝම ව ස්වභාවික සම්පත් හා පරිසරය ද කිසියම් ප්‍රමාණයකින් ව්‍යසනයකට පත් කරගෙන ඇත (Yangli-Ming, 1996). කෙසේ වුව ද චීනයේ ජනගහනය දිගින් දිගට ම අඩුවීමේ වර්ධන වේගයන් වාර්තා කර ඇත. එසේ ම මෙම සංවර්ධන උපනතීන් මෑතකාලීන ව අඩුවීමේ ප්‍රවණතාවයක් වාර්තා කර ඇති අතර, චීනයේ ග්‍රාමීය අංශයේ අනාගත ආර්ථික සංවර්ධනයේ දී සැලකිය යුතු මට්ටමේ අභියෝගයන් රැසකට මුහුණ පෑමට සිදු වෙනු ඇත.

මධ්‍යම සැලසුම්ගත චීන ආර්ථිකයේ සීමාකම් හා නීතිමය බාධක තවමත් මුල්බැස ගෙන තිබිය දී හා රජය අඛණ්ඩ ව වෙළෙඳපොළ මැදිහත්වීම් ඇති කරද්දී යන මූලික කරුණු දෙකේ බලපෑම තිබිය දී චීනය තුළ ග්‍රාමීය ආර්ථික ප්‍රතිසංස්කරණයන් ක්‍රමානුකූල ව ක්‍රියාත්මක වෙමින් පවතී. එම බලපෑම් හේතු කොටගෙන ග්‍රාමීය අංශය ඉතාමත් වේගයෙන්, මධ්‍ය සැලසුමක සිට වෙළෙඳපොළ කරා නැඹුරු වූ ආර්ථික ක්‍රමයකට ප්‍රවේශ වී ඇත. කෙසේ වෙතත් කෘෂි ඵලදයීතාවය වැඩිවීම සඳහා සම්පූර්ණයෙන් ම දායක වූයේ නව පරිවර්තීය ආර්ථික ප්‍රතිසංස්කරණයන් ය. ග්‍රාමීය අංශයේ තිරසාර ආදායම් වර්ධනයක් ඇති කිරීම සඳහා හේතු වන කරුණු කීපයක් ම ඉතා මැනවින් අධ්‍යයනය කළ යුතු ව ඇත. මේ සඳහා චීනයේ ග්‍රාමීය නිෂ්පාදන යෙදවුම්, ඉඩම් හා වෙළෙඳපොළ යන සාධක වර්ධනය කරමින් කටයුතු කළ යුතුව ඇත්තේ, ඒවා තවමත් ඉතාමත් පහත් මට්ටමක පවතින හෙයිනි. ඉතා ශක්තිමත් හා ක්‍රියාකාරී ආයතනික ව්‍යුහයන් හා රටාවන් චීනයට අවශ්‍ය වන අතර, ඒවා මගින් ක්‍රියාකාරී මූල්‍ය පද්ධතියක් මෙන් ම ග්‍රාමීය මූල්‍ය ක්‍රමයක් ද, ප්‍රායෝගික ව ක්‍රියාත්මක කළ හැකි කෘෂි ඉඩම් පරිහරණ කළමනාකරණයක් ද අවශ්‍ය වී ඇත. එමෙන් ම වෙළෙඳම, පාදක ව්‍යුහමය ආයෝජන සහ පරිසර කළමනාකරණය, කෘෂිකාර්මික සමාජයේ සමාජ-ආර්ථික සංවර්ධනයට උචිත පරිදි සකස් කළ යුතු ව ඇත.

ග්‍රාමීය ජනතාවගේ ජීවන මට්ටම තව තවත් උසස් කිරීමටත්, ග්‍රාමීය දරිද්‍රතාවය මුලිනුපුටා දැමීමට සහ ග්‍රාමීය හා නාගරික අංශයේ පවතින උග්‍ර ආදායම් විෂමතාවයන් සමනය කිරීමටත්, ඉතාමත් කාර්යක්ෂම හා ක්‍රියාකාරී ආකාරයකට ඵලදයීතාවය වර්ධනය කළ යුතු ව ඇත. මේ සඳහා යෝග්‍ය හා දායක වන ආයෝජන සංවර්ධන වැඩපිළිවෙළක අවශ්‍යතාවය කැපී පෙනේ. එහි දී ඉතා තියුණු කාර්යක්ෂම හා ක්‍රියාකාරී සංවර්ධන ප්‍රතිපත්ති පද්ධතියක් නිර්මාණය කළ යුතු ව ඇත. ඒ මගින් දැනට පවතින සහ නව ආයතනික පද්ධතියක් හා රටාවක් ඇති කර ගත යුතු අතර, ඒවා පූර්ණ වශයෙන් ම වෙළෙඳපොළ මූලධර්මයන් මත පදනම් විය යුතු ය. දිගුකාලීන ව රජය විසින් කාර්මික හා වෙළෙඳ කටයුතු විවිධාංගීකරණය කළ යුතු ව ඇති අතර, මූල්‍ය අයෝජන, මහජන සේවා, පර්යේෂණ, සංවර්ධන ව්‍යාප්ති සේවා සහ පාදක ව්‍යුහමය අංශ කෙරේ දැඩි අවධානය යොමු කළ යුතු ව ඇත. එබැවින් ආර්ථික ප්‍රතිපත්ති පද්ධතිය තුළින් රාජ්‍ය පරිපාලන තන්ත්‍රයේ කාර්යභාරය වැඩි දියුණු කර සංවර්ධනය කිරීමත් වෙළෙඳපොළ කරා රජයේ මැදිහත්වීම අවම කිරීමත් කෙරේ මූලික අවධානය යොමු කරන්නක් විය යුතු ය (World Bank, 1999). චීන ග්‍රාමීය ආර්ථික පරිපාලනයේ මූලික පරමාදර්ශය වී ඇත්තේ එහි සංවර්ධන ප්‍රතිපත්තීන් තවදුරටත් කාර්යක්ෂම කිරීම, රාජ්‍ය ආයෝජන මගින් සම්පත් බෙදී යෑමේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම, නිෂ්පාදන සඳහා තුලනාත්මක 'සාපේක්ෂ වාසි' ඇති කිරීම, එමගින් ඵලදයීතාවය වර්ධනය කර, කාර්යක්ෂම වූ වෙළෙඳපොළක් බිහි කර ගැනීම කෙරෙහි ය. තව ද මෙම දර්ශනය මත දේශපාලන හා ආර්ථික පරිපාලකයින්ට, කාර්යක්ෂම විවෘත වෙළෙඳපොළ කාර්යක්ෂමතාව කරා යොමු කිරීමටත්, ජාතික සුබසාධක වැඩකටයුතු වඩාත් උචිත සහ ඉහළ ධාරිතාවයකින් යුතුව කරගෙන යෑමටත්, ජාතික මට්ටමේ දරිද්‍රතාවය තුරන් කිරීමටත්, ධනය නැවත බෙද හැරීම හෝ ආදායම් විෂමතාවය සමනය කිරීමටත්, ස්වභාවික සම්පත්

කළමනාකරණය හා පරිසර දූෂණය ක්‍රමවත් පරිදි පාලනය කිරීමටත් සෘජු ව මැදහත් වෙමින්, ඒවා සංවර්ධනය කළ හැක (World Bank, 1999).

## 5. ග්‍රාමීය ව්‍යාපාර සංවර්ධනයෙන් ලැබූ ආර්ථික ජයග්‍රහණයන්

ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙළ ක්‍රියාත්මක වන කාලයේ දී, ඉහළ ආර්ථික වර්ධනයක් සඳහා නාගරික සංවර්ධනය හා ග්‍රාමීය ව්‍යාපාරික කර්මාන්ත (Township and Village Enterprise : TVE) සංවර්ධනයෙන් ලැබුණු දායකත්වය අතිවිශාල ය. එමෙන් ම අසාමාන්‍ය විය. මෙම නාගරික හා ග්‍රාමීය ව්‍යාපාර සංවර්ධන වැඩපිළිවෙළ මගින් දළ ජාතික කර්මාන්ත අංශයේ වටිනාකමට එකතු වන අගය සියයට 30ක් පමණ වන අතර, එහි මුළු සේවා නියුක්තිය දශ ලක්ෂ 130 ක් පමණ විය (Zhang, 2003). මොවුන්ගෙන් වැඩි ප්‍රමාණයක් නියෝජනය වන්නේ, ග්‍රාමීය අංශයේ ගොවිපොළ නො වන රැකියාවන් හි නියුතු ශ්‍රමිකයන් ලෙසිනි. අවාසනාවකට මෙන්, නිමැවුම් වටිනාකම සහ සේවා නියුක්ති වර්ධනය, අඩු වෙමින් පවතින අතර, ණය ලබා ගැනීමේ හැකියාවන් සීමාවෙමින් පවතී. එමෙන් ම ග්‍රාමීය ණය ගැති බවේ දැඩි බව උග්‍ර වී ඇත. කෙසේ වෙතත් ආර්ථික පරිසරයේ ඇති වන මෙම වෙනස්වීම් හේතු කොටගෙන සාමූහික හා සමූපකාර ක්‍රමයෙන් ඈත් ව පෞද්ගලික අයිතියෙන් යුතු කළමනාකරණයක් කරා යාමක් දක්නට ඇත. වර්ෂ 1997 වන විට නාගරික සංවර්ධන හා ග්‍රාමීය කර්මාන්තවලින් සියයට 90ක් පෞද්ගලික අයිතිය යටතේ වූ අතර නාගරික හා ග්‍රාමීය කර්මාන්ත අංශයේ සේවා නියුක්තියෙන් හරි අඩක් මෙම අංශයේ දක්නට විය (Huang, *et al*, 2000). එමෙන් ම මෙම ආයතනවල කළමනාකරණ ව්‍යුහය පැවතුනේ සාමූහික කළමනාකරණ ක්‍රමයක් යටතේ බැවින් ඒවා ඉතා ඉක්මනින් ස්ථාවර වැටුප් ලබන කළමනාකරණ ක්‍රමයක් බවට පත් විය. මෙම කළමනාකරණ ක්‍රමය ද ඉතා ඉක්මනින් ලාභ බෙදී යාමේ සහ ස්ථිර හා බදු දීමේ ක්‍රමයන්ට ප්‍රතිචාර දැක්විය.

වේගවත් සංවර්ධනයක් සිදු වූ ආරම්භක අවධියේ මෙන් ම ඊට පසු කාලයේ දී ද එවකට පැවති ග්‍රාමීය කර්මාන්ත තවදුරටත් දක්නට නොවීය. නිෂ්පාදන තරඟයේ දී ඇතැම් නිෂ්පාදන කර්මාන්ත ඉතාමත් කාර්යක්ෂම වූ අතර, ඒවා මුල්කාලීන ව ඉතා විශාල ලාභ ලැබූ තත්ත්වයන් හේතු කොටගෙන නිෂ්පාදන පිළිබඳ තරඟකාරී පීඩනය තුරන් කරන ලදී. කෙසේ වෙතත් චීනයේ අභ්‍යන්තර පළාත් මේ සඳහා විශේෂ වාසි ලැබූ අතර, ඊට බලපෑ ප්‍රධාන අවාසියක් වූයේ, ප්‍රධාන හා ඉහළ ආදායම් ලබන වාණිජ නගරවලින් වෙන් ව පිහිටීම ය. එසේ ම ලැබූ අමතර වාසි වූයේ, අඩු පිරිවැයක් සහිත ශ්‍රමය ලැබීම හා වඩාත් හොඳ කෘෂිකාර්මික අමුද්‍රව්‍ය ලබා ගැනීමේ හැකියාවන් ය. සමහර නාගරික සංවර්ධන හා ග්‍රාමීය කර්මාන්ත යම් ආකාරයකින් නැවත පිහිටුවීමට සිදු වූයේ මෙම අභ්‍යන්තර වාසි ප්‍රයෝජන ලබා ගැනීමට ය. ඇතැම් අභ්‍යන්තර පළාත්වල පිහිටි අවාසි සහගත දුෂ්කර ප්‍රදේශයන් සංවර්ධනය කිරීමට අවශ්‍ය කටයුතු යෙදිය යුතු අතර, ඒ සඳහා සහනාධාර ක්‍රම භාවිතා නො කළ යුතු ය. මෙහි දී කුඩා පරිමාණ ගෘහස්ථ කර්මාන්තවල යෙදෙන්නන් ඉලක්ක කරගත යුතු බැවින් දේශීය ව පවතින කුඩා වෙළෙඳපොළ සහ කර්මාන්තවල ඇති තුලනාත්මක වාසි හා පිරිවැය හෝ කෘෂිකාර්මික අංශයේ ඇතැම් නිෂ්පාදන

කර්මාන්තයන් යොද ගත හැකි ය. එසේ වුවත් එම කර්මාන්ත අංශයේ පවතින කර්මාන්තවලට වඩා අවධානය යොමු කළ යුතු ය. එමෙන් ම නිල වශයෙන් රජයෙන් කෙරෙන මෙම මැදිහත්වීම මගින් ග්‍රාමීය කර්මාන්තවල කළමනාකරණය සහ ප්‍රාග්ධන යෙදවුම් ගැන විශේෂ අවධානය යොමු කළ යුතු ව ඇත්තේ එමගින් අනෙක් ප්‍රදේශවල ද සාර්ථක ව මෙම කර්මාන්ත සංවර්ධනය කළ හැකි නිසා ය (World Bank, 1999).

නාගරික ව හා ග්‍රාමීය කර්මාන්ත ව්‍යාපාර සංවර්ධනයේ දී එම අංශයේ මූල්‍ය අවශ්‍යතාවයන් සම්පූර්ණ කිරීමට 'මූල්‍ය වෙළඳපොළට' නො හැකි වීම ඉතා බරපතල ගැටළුවක් විය. ග්‍රාමීය මූල්‍ය ප්‍රතිසංස්කරණය විසින් බොහෝ ණය අවශ්‍යතාවන් කපා හරිනු ලැබීම නිසා නාගරික හා ග්‍රාමීය ව්‍යාපාර සංවර්ධනයට ණය ලබා ගැනීමේ හැකියාව බොහෝ සෙයින් අඩු විය. එසේ ම නාගරික හා ග්‍රාමීය කර්මාන්ත ව්‍යාපාරවල පවතින වැඩි අවදානම සහ අඩු විශ්වසනීයත්වය, ණය පිළිබඳ ගැටළුවේ දක්නට ලැබෙන ප්‍රධාන අංශයක් විය. කෙසේ වුව ද, වැදගත් කාරණය නම්, නාගරික හා ග්‍රාමීය කර්මාන්ත අංශය වනාහි කර්මාන්ත අංශයේ ඉතාමත්ම ක්‍රියාකාරී අංශය වීම යි. එහෙයින් ජාතික ආර්ථිකයට එහි ඇති වැදගත්කම නිසා ම නව විධිමත් ක්‍රම හා මාර්ග ඇති කරමින් ණය ලබා ගැනීමේ හැකියාව වර්ධනය කිරීමට වීනය කටයුතු කළ යුතු ය. සවිස්තරාත්මක මූල්‍ය සම්පාදනයේ දී 'ණය දීමේ දී' හා 'ණය පිළිබඳ ඇපකරයන්' ඉතා ම වැදගත් වන අතර, 'කුඩා හා මධ්‍යම පරිමාණ' කර්මාන්තයන් පවතින ආයතන මගින් ණය ලබා ගැනීම එක් විකල්ප ක්‍රමයක් වනු ඇත. මූල්‍ය කළමනාකරණය වැඩි දියුණු කරමින් සංවර්ධනය කිරීමත්, ක්‍රියාකාරීත්වයන් පිළිබඳ දක්ෂතාවය වර්ධනය කිරීමත් පුහුණු කිරීමේ වැඩසටහන්වලට ඇතුළත් කළ යුතු අතර ම, ණය දෙන ආයතනත්, ණය ලබා ගන්නා කර්මාන්ත ආයතනත්, එක් ව කටයුතු කළ යුතු ය. එමෙන් ම ඒවා මූල්‍ය සංවර්ධන වැඩසටහන්වල කොටස් බවට පත් විය යුතු ය (World Bank, 1999).

## 6. ග්‍රාමීය අංශයේ ආර්ථික වර්ධනය බිඳ හෙළන මූල්‍ය ප්‍රතිපත්ති

'අකාර්යක්ෂම ග්‍රාමීය මූල්‍ය ක්‍රමය' සංවර්ධනය වෙමින් පවතින රටවල ග්‍රාමීය සංවර්ධන ක්‍රියාවලියේ දී හමුවන ප්‍රබල බාධකයකි. විමධ්‍යගතකරණය තුළින් ග්‍රාමීය මූල්‍ය ව්‍යුහය ස්වයංපෝෂිත වීමත්, නාගරික අංශයේ කර්මාන්ත සඳහා ක්‍රියාකාරී නීතිමය පද්ධතියක් සංවර්ධනය වීමත් යන කරුණු හේතු කොටගෙන ඇති වූ රාජ්‍ය අයවැය ලේඛනයෙන් මූල්‍ය ප්‍රතිපාදන ලබාදීම පිළිබඳ විවිධාකාර සංරෝධක ඇති විය. එබැවින් බොහෝ මූල්‍ය ප්‍රතිපාදන රජයේ දිගුකාලීන අරමුණු හා ආර්ථික අරමුණු අතර ගැළපීමක් නො කළ අතර, ආර්ථික වර්ධනය සඳහා වූ පාදක ව්‍යුහමය සංවර්ධන කටයුතු සඳහා යොද ඇත්තේ සාපේක්ෂ ව අඩු මූල්‍ය ආයෝජනයකි.

මෙහි ප්‍රතිඵලයක් ලෙසට 'බදු අය කළ හැකි' සහ විශාල සංවර්ධන ධාරිතාවයක් ඇති දේශීය කර්මාන්ත තුළ සැලකිය යුතු ආයෝජනයක් මෙන් ම වර්ධනයක් ඇති නොවීය. ආර්ථික ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක වූ පසුගිය දශක කීපයේ ම ජාතික බදු

ආදායම අඩු වූ අතර එය දළ දේශීය ආදායමින් සියයට 12 ක් පමණ විය (Yongding, 2001). එය ලෝකයේ අඩු ම බදු ආදායම් මට්ටමකි. එබැවින් 1993 දී ආරම්භ කරන ලද මූල්‍ය ප්‍රතිසංස්කරණයන් මුල් කරගෙන "එකතු කරන ලද වටිනාකම් පිළිබඳ බදු ආදායම්" වර්ධනය වුව ද, ආර්ථික ශක්තියෙන් ඉහළ සංවර්ධිත පළාත්වල ද, පහළ සංවර්ධිත පළාත්වලද බදු ආදායම් එකතු කිරීම අඩු වී ඇත. කෙසේ වෙතත්, බදු ආදායම් නැවත ආයෝජනය කිරීමේ දී තවමත් නාගරික ප්‍රදේශවල සංවර්ධනය සඳහා වැඩි නැඹුරුතාවයක් (urban biased) දක්වන අතර එම ආදායම් මට්ටම් ද පිරිහෙමින් පවතී. එසේ ම එම මූල්‍ය සම්පත් නැවත ජාතික මට්ටමේ බෙද හැරීමේ ක්‍රියාවලිය අකාර්යක්ෂම වීම නිසා ආදායම් විෂමතාවය උග්‍ර වී ඇත. එහෙයින්, බදු අය කිරීමේ සමානතාවය, සම ආදායම් ව්‍යාප්තිය සහ මහජන සේවා හා පොදු භාණ්ඩ සඳහා යන රාජ්‍ය වියදම් වෙන් කිරීම්, විශේෂයෙන් ම දරිද්‍රතාවයෙන් වැඩි පළාත් සඳහා අඩු වී ඇත. තව ද ග්‍රාමීය අංශය තුළින් නාගරික අංශය කරා ගලා යන මූල්‍ය ධාරාව වාර්ෂික ව බිලියන 100 ක් දක්වා ඉහළ ගොස් ඇති අතර, ග්‍රාමීය අංශයේ ආයෝජන සහ සම්පත් පරිහරණය ඉතාමත් සීමාකාරී මට්ටමක පත් වී ඇත (Gerald and Rauch, 2000). මේ අනුව ග්‍රාමීය අංශයෙන් ඉවතට ගලා යන අතිවිශාල මූල්‍ය සම්පත් ප්‍රමාණය දක්වා සිටින්නේ චීන ජාතික ආර්ථිකයට ග්‍රාමීය අංශයේ ඇති වැදගත්කම සහ ග්‍රාමීය අංශය ඉතා කාර්යක්ෂමව හා නිරෝගී ව පවත්වාගෙන යෑමේ ඇති වැදගත්කමත් ය.

පසුගිය දශකය තුළ දී නාගරික හා ග්‍රාමීය යන දෙඅංශයට ම රාජ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලැබීම සියයට 66 කින් හෙවත් 2/3 කින් අඩු වී ඇත (Zhang and Zhang, 2002). මේ නිසා විශාල වශයෙන් පැවැති පරිසර හානි අවම වී ඇති අතර, බදු අය කිරීමේ ආයතනයන්ගේ සංඛ්‍යාව ද අඩු වී ඇත. එබැවින් ප්‍රාදේශීය ආණ්ඩු විසින් නිල වශයෙන් බදු නො වන වෙනත් ගාස්තු හා අය කිරීම් නිෂ්පාදකයන් හා පරිභෝගිකයන් වෙත පනවා ඇත. එමගින් නව රාජ්‍ය මූල්‍ය යාන්ත්‍රණ නිර්මාණය කර ඇති අතර, ඇතැම් කාර්යයන් සඳහා මධ්‍යම රජය විසින් මූල්‍ය ප්‍රතිපාදන ලබා දිය යුතු වුවත්, ඒවා ලැබෙන තෙක් නො සිට අවශ්‍යයෙන් ම කළ යුතු සමාජ කාර්යයන් සඳහා එම මුදල් වැය කෙරෙනු ඇත. රාජ්‍ය අයවැය ලේඛනයෙන් වර්ගීකරණය නො කරන ලද සහ රාජ්‍ය අයවැය ලේඛනයට හසු නො වන මෙම ආදායම් මාර්ග පහසුවෙන් හඳුනාගත හැකි අතර, ඒවා ප්‍රධාන වශයෙන්ම සංකීර්ණ මෙන් ම විවිධාකාර වේ. මෙම ආදායම් මාර්ගයන් බොහෝ විට ග්‍රාමීය කුඩා කර්මාන්තවලින් ලැබෙන අතර, බොහෝ දරිද්‍රතාවයෙන් යුතු ග්‍රාමීය ප්‍රදේශවල මෙම කර්මාන්ත පිහිටා ඇත්තේ ඉතාමත් අල්ප වශයෙනි. එසේ ම මෙම බදු ආදායම් අය කිරීම එම ප්‍රදේශවල කර්මාන්ත ව්‍යාප්තියට සහ වර්ධනයට ඇති වූ ප්‍රබල බාධකයකි. අයවැය ලේඛනයට අයත් නො වන මෙම ගාස්තු එකතු කිරීම්, නිල රාජ්‍ය අනුදැනීමකින් තොරව මෙන් ම විවිධත්වයකින් ද තොර වේ. එසේම ඒවා නිරන්තරයෙන් ම ගතික ස්වභාවයකින් යුක්ත වන නිසා ඒකාබද්ධ බවින් තොර, බණ්ඩනය වූ ස්වභාවයකින් යුක්ත වේ. ඒවා දිගුකාලීන හා කෙටිකාලීන වශයෙන් ආයෝජන බෙද හැරීමේ කාර්යක්ෂමතාවය වළක්වන අතර, නිරන්තරයෙන් ම ග්‍රාමීය අංශය, නාගරික අංශයෙන් වෙන් කර තැබීමට හේතු වී ඇත. මේ අනුව හදිසි මෙන් ම ක්ෂණික අමතර මූල්‍ය සම්පත්වල අවශ්‍යතාවය සඳහා රජය මෙම ගාස්තු හා අයබදු ආදායම් විනිවිද

භාවයකින් යුතු තිල රාජ්‍ය අයබදු ක්‍රමයේ කොටස් බවට පරිවර්තනය කළ යුතු ය (Zhang and Zhang, 2002).

ස්වභාවික වනාන්තරවල ආරක්ෂාව සහ සංරක්ෂණය, කෘෂිකාර්මික පර්යේෂණ හා ව්‍යාප්ති සේවා, අධ්‍යාපනය, සෞඛ්‍යය සහ වෙනත් සුබසාධක සමාජ සේවාවන් සපයන උපකාරක ආයතන පවත්වාගෙන යෑමට ප්‍රමාණවත් මූල්‍ය පහසුකම් නො ලැබීම නිසා, නිරන්තරයෙන් ම සිදු වී ඇත්තේ එම ආයතනයන් හි මානව හා මූල්‍ය සම්පත් අමතර ආදයම් ලබා ගැනීම උදෙසා වෙනත් වාණිජ කටයුතු සඳහා යොමු කරවීම යි. මේ නිසා 'පාදක ව්‍යුහමය' සංවර්ධන කටයුතු සඳහා ලැබෙන මූල්‍ය සම්පත් නිරන්තරයෙන් ම යොමු වන්නේ වැටුප් හා පුනරාවර්තන වියදම් පියවා ගැනීමට ය. එසේ ම ඇතැම් ආරක්ෂිත ආයතනයන් විසින් සම්පත් පරිහරණය කිරීම හා ආරක්ෂාව වෙනුවෙන් දරන පිරිවැය පියවා ගැනීමට ඒ සඳහා ගාස්තු අය කරමින් ආදයම් උපදවීමට කටයුතු කර ඇත. තව ද චීනයේ ග්‍රාමීය අංශයේ තිරසාර ආර්ථික වර්ධනයක් පවත්වාගෙන යෑමටත්, ග්‍රාමීය දරිද්‍රතාවය තුරන් කරලීමට සහ ග්‍රාමීය පාදක ව්‍යුහමය සේවා දියුණු කර පවත්වාගෙන යෑමටත් මූල්‍ය ප්‍රතිසංස්කරණ තුළින් ඉමහත් පිටිවහලක් ලබාගෙන ඇත. මෙම මධ්‍යගත ආර්ථික ක්‍රමය තුළින් උද්ගත වන ප්‍රතිවිපාක අධ්‍යයනය කළ යුතු අතර, එමගින් අමතර ආදයම් මූලාශ්‍ර සොයා ගැනීමටත් වියදම් අඩු කිරීමේ උපාය මාර්ගයන් සකසා ගැනීමටත්, කටයුතු කළ නාගරික ප්‍රදේශවලින් ග්‍රාමීය ප්‍රදේශ කරා මූල්‍ය සම්පත් සංක්‍රමණයේ දී ඉතාමත් තරහකාරී, ප්‍රතිපත්තිමය තීරණයන් ගත යුතු ය (දියුණු කාර්මික ප්‍රදේශ හා අතිරික්ත ආදයම් සහිත නාගරික ප්‍රදේශ හැර). මේ හේතුව නිසා පරිපාලන නිලධාරීන්ගේ සංඛ්‍යාව අඩු කරන අතර ම එමගින් විශාල වශයෙන් නාගරික ප්‍රදේශවල වැටුප් පිරිවැය අඩු කරනු ඇත. පහළ මට්ටමේ සේවක සංඛ්‍යාවන් අඩු කිරීම නිසා බොහෝ විට ප්‍රතිපත්තිමය ක්‍රියාකාරීත්වයන් ඇතිවන ඇතැම් කරුණු හෙළිදරව් වීම මගහැරී යනු ඇත. එබැවින් ප්‍රාදේශීය පළාත් ආණ්ඩුවල ඇති ප්‍රතිපත්ති සහ වැඩසටහන් හි ආර්ථික/මූල්‍ය ප්‍රතිසංස්කරණයන්වල ඇති අවශ්‍යතාවය වඩ වඩාත් තහවුරු කරනු ඇත (Huang, 2000).

## 7. ග්‍රාමීය ණය ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය

අනෙකුත් ප්‍රධාන ආර්ථික අංශවලට වඩා මූල්‍ය අංශයේ ප්‍රතිසංස්කරණ සිදු වනුයේ ඉතාමත් මන්දගාමී ව ය. එමෙන් ම රජය තවමත් මෙම අංශය සඳහා 'දැඩි පාලන නීතිරීති' අනුගමනය කරන බව දක්වා ඇත. ප්‍රධාන මූල්‍ය ආයතන කීපයක් ග්‍රාමීය අංශයේ ප්‍රයෝජනය සඳහා සංවර්ධනය කළ ද, වැඩි වශයෙන් ණය ලබා ගැනීමේ පහසුකම් අවශ්‍ය වී ඇත්තේ ග්‍රාමීය කර්මාන්ත අංශයට ය. එසේ ම රාජ්‍ය ආයතන විසින් ධාන්‍ය හා කපු නිෂ්පාදන මිල දී ගැනීමේ වැඩසටහන ක්‍රියාත්මක කෙරේ. ග්‍රාමීය ණය පදනම් ක්‍රමය හා කුඩා ම මෙන් ම නව රාජ්‍ය ණය ආයතනයන් පමණක්, ප්‍රධාන වශයෙන් විධිමත් ණය ආයතන වශයෙන් සැලකිය හැකි ය. මෙම ආයතන පමණක් මූලික වශයෙන් ම ණය ලබා දෙනුයේ ග්‍රාමීය-කෘෂිකාර්මික ගෘහස්ථ ඒකකයක් සඳහා ය. පොලී රහිත සහ පොලී සහිත අවිධිමත් ණය ක්‍රම දෙක ම ග්‍රාමීය කෘෂිකාර්මික නිෂ්පාදන ණය ලබාදීමේ දී ඉතාමත් වැදගත් වේ.

ප්‍රත්‍යක්ෂ වශයෙන් ම 'ණය ලබාදීමේ ප්‍රතිපත්තිවල දී' වාණිජ මට්ටමේ ණය දීම පිළිබඳ ඉතා පැහැදිලි වෙන් කිරීමක් හා විනිවිදභාවයක් අවශ්‍ය වී ඇත.

රාජ්‍ය අංශයේ ණය දීමේ ප්‍රතිපත්තිය සම්පූර්ණයෙන් ම ධාන්‍ය මිල දී ගැනීමේ පිළිවෙත හා සම්බන්ධ වී ඇති බව චීනය පූර්ව වශයෙන් අවබෝධ කරගෙන ඇත. විශේෂයෙන් ම එහි දී උපාය මාර්ගික ධාන්‍ය තොග පාලනය සහ අනාගතයේ ඇති විය හැකි තොග නැති වී යෑම් පිළිබඳ අලාභයන් වැදගත් වේ. තනි ආයතනික, ණය දීමේ ප්‍රතිපත්ති ගැන අවධානය යොමු කිරීමේ දී ඒවායේ විශ්ලේෂණ ඇගයීම් පිළිබඳ පිරිවැය, පසු විපරම් ක්‍රම, සහනාධාර අවශ්‍යතාවයන් හා ඒවායේ බලපෑම් ආදිය ඉතා වැදගත් වේ.

ග්‍රාමීය ණය දෙන ආයතන ප්‍රමාණවත්, ඵලදායී සේවාවක් ග්‍රාමීය අංශයට සිදු කරන්නේ නම්, චීනය අනිවාර්යයෙන් ම පොලී අනුපාත පාලනයෙන් බැහැර විය යුතු ය. ග්‍රාමීය මූල්‍ය ආයතන තම මූලික අවධානය 'ණය ලබාදීම පිළිබඳ' යොමු කළයුතු ව ඇත. නමුත්, ඔවුන් තම ණය සේවා කටයුතු ග්‍රාමීය ජනතාවට ලබාදීමට යෑමේ දී, නව තැන්පතු ක්‍රම ඇති කළ යුතු ය. එම ක්‍රම ලාභ ඉපැයීම් හා ද්‍රවශීලතාවය හා එක්ව සකස් විය යුතු ය. එමගින් නව ඉතිරි කිරීමේ ක්‍රම හා තැන්පතු වඩාත් ආකර්ශනීය වනු ඇත. තව ද, ප්‍රතිපත්තිමය උපකරණ හා එක්වීමෙන්, ග්‍රාමීය වෙළඳපොළ වඩාත් දියුණු වෙමින් වර්ධනය වී ඇත. එමගින් ගොවීන්ගේ තැන්පතු මට්ටම්වල පරිවර්තනයක් වන්නේ ඔවුන් ධාන්‍ය වශයෙන් තැන්පතු පවත්වනවාට වඩා මූල්‍ය තැන්පතු වැඩි වැඩියෙන් වර්ධනය කිරීමට පෙළඹී ඇති නිසා ය. එම නිසා තැන්පතු සම්බන්ධව මූල්‍ය ස්ථාවරත්වය හා නීතිමය ආරක්ෂාව පොදු මූල්‍ය නීති-රීති පද්ධතියක් මගින් ආරක්ෂා කොට තැබිය යුතු ය. එමෙන් ම අනවශ්‍ය සීමාකම් සහිත නීතිරීති ඉවත් කළ යුතු ව ඇත (Zhigang, 1996).

ග්‍රාමීය මූල්‍ය ආයතනවල පවතින අඩු හා නුසුදුසු තාක්ෂණික ශිල්පීය ක්‍රම මෙන් ම මූල්‍ය කළමනාකරණ හැකියාවන් පිළිබඳ ගැටළු ග්‍රාමීය ණය දීමේ වැඩපිළිවෙළක දී දක්නට ඇති ප්‍රධාන සංරෝධයන් වී ඇත. එමගින්, විකල්ප ක්‍රම මගින් නව ණය දීමේ ව්‍යාපෘතීන් සඳහා වූ ඇගයීමේ හා විශ්ලේෂණය කිරීමේ කටයුතු සීමා කරන අතර, ලබාගත් ණය මුදල් යෝග්‍ය පරිදි ඇගයීමකට හෝ නිසි තක්සේරුවකට භාජනය කළ නො හැකි ය. මේ නිසා චීනයේ 'ග්‍රාමීය මූල්‍ය ආයතනවල' දැනට පවතින ශක්‍යතාවය, ධාරිතාවය හා ණය මුදල් පිළිබඳ යෝග්‍යතාවය පිළිබඳ ඇගයීමේ හැකියාව වැඩිදියුණු කළ යුතු ය. ඒ සඳහා, ණය ආපසු ගෙවීමේ හැකියාව නීතිමය වශයෙන් වර්ධනය කිරීමත්, ණය ආපසු ගෙවීමේ අනුපාතය හා ණය පිළිබඳ ඉතිහාසය අධ්‍යයනය කර භාවිතා කිරීමත්, ණය සඳහා ප්‍රමිතිගත ගිණුම් ක්‍රමයක් හඳුන්වා දී සංවර්ධනය කිරීමත්, ණය ලබා ගැනීමේ ක්‍රියාවලිය හෝ පිළිවෙළ වාර්තා කිරීමත්, වත්කම් හා ආපසු ගෙවීමේ හැකියාව ඇගයීමත් වත්කම් ආපසු විකිණීම සඳහා යෝග්‍ය වෙළෙඳපොළක් සංවර්ධනය කිරීමත් කළ යුතු වේ. එසේ ම මූල්‍ය තරඟකාරීත්වය හා විශේෂිත මෙන් ම විවිධ අංග ලක්ෂණ සහිත ණය ඉල්ලුම් අවශ්‍යතාවයන් සපුරාලන පරිදි ග්‍රාමීය මූල්‍ය ආයතන විවිධාංගීකරණය කළ යුතු ය. එබැවින් එම ආයතන පූර්ණ බැංකු සේවා සපයන ආයතනවල සිට ග්‍රාමීය

කර්මාන්ත සඳහා ණය ලබා දෙන විශේෂිත බැංකු සේවා සැපයීමේ ආයතන දක්වාත්, එම ආයතන ග්‍රාමීය සූක්ෂම මූල්‍ය ආයතනයන් (Rural Micro Finance Institutions) දක්වාත් වෙනස් විය යුතු ය (Zhigang, 1996).

## 8. ග්‍රාමීය ආදායම, ගොවිපොළ නො වන රැකියා ඉඩ ප්‍රස්ථාවන් හා නාගරික හා ග්‍රාමීය ව්‍යාපාර සංවර්ධනය

මෑතකාලීන චීනයේ කෘෂිකාර්මික අංශයේ ආදායම් සීඝ්‍රයෙන් වර්ධනය වූයේ ප්‍රධාන වශයෙන් ම කෘෂි භාණ්ඩවල ගොවිපොළ මිල ගණන් සීඝ්‍ර ලෙස ඉහළ යෑමේ ප්‍රතිඵලයක් ලෙසට ය. මෙම දේශීය ගොවිපොළ මිල ගණන් සඳහා ජාත්‍යන්තර මිල ගණන් විකල්ප වශයෙන් පූර්ණ ලෙස ප්‍රයෝජනයට ගන්නා බැවින්, ගොවිපොළ මිල ගණන් ජාත්‍යන්තර මිල ගණන්වලට සමාන විය හැකි ය. එසේ නො වන්නේ නම් රජය විසින් මූල්‍ය සහනාධාර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මගින් ගොවීන්ගේ ආදායම් මාර්ග වඩාත් සුරක්ෂිත කරනු ලැබිය යුතු ය. එසේත් නැතහොත් තම කෘෂි නිෂ්පාදනයන් නො සලකා හරිමින් කටයුතු කිරීම හෝ ලෝක වෙළෙඳ සංවිධානයේ නීතිරීති මත කටයුතු කළ යුතු ව ඇත. මේ අතර විකල්ප ගොවිපොළ ආදායම් ඉහළ නැංවීමේ දී පහත සඳහන් කරුණු වඩාත් වැදගත් වනු ඇත.

1. නිෂ්පාදන සාධකවල ඵලදායීතාවය වර්ධනය කිරීම.
2. ශ්‍රම සූක්ෂම ශිල්ප ක්‍රමයන් සහිත ව වැඩි වටිනාකම් සහිත කෘෂි නිෂ්පාදනවලට යොමු කිරීම හෙවත් නිෂ්පාදන විවිධාංගීකරණය කිරීම.
3. කෘෂි භාණ්ඩ සඳහා ප්‍රවාහන පහසුකම් ලබා දී, වෙළෙඳපොළ පාදක ව්‍යුහමය පහසුකම් වැඩි දියුණු කිරීම, වෙළෙඳපොළ අලෙවිකරණ පිරිවැය අඩු කිරීම වැනි කටයුතු සඳහා වැඩි මූල්‍ය ආයෝජනයක් ඇති කිරීම සහ ගොවීන්ගේ පාරිභෝජන වියදම්වල දයකත්වය වැඩි කිරීමට කටයුතු කිරීම.

මෙම විකල්ප මාර්ග සඳහා බලපාන කරුණු පිළිබඳ ව ලෝක බැංකුව සහ තවත් විවිධ දේශීය හා විදේශීය ආයතන රාශියක් විවිධ අධ්‍යයනයන් රැසක් සිදු කර ඇත.

ගොවිපොළ නො වන රැකියා මූලාශ්‍රයන් වර්ධනය කිරීම හා බහුල කිරීම ගොවි ආදායම් වර්ධනය කිරීමේ ස්ථිරසාර ප්‍රත්‍යක්ෂ වූ පියවරකි. අතීතයේ පැවති නාගරික හා ග්‍රාමීය ආයතනික සංවිධාන විසින් ගොවිපොළවලින් ශ්‍රම බලය ඉවත් කිරීම තහනම් කරන ලදී. මෑතකාලීන ව ඇති වූ ගොවිපොළ නො වන රැකියා වැඩ කටයුතුවල වර්ධනය මගින් සමකාලීන ව පැවති සියළු බාධකයන් ඉවත් කරන ලදී. දනට චීනයේ සිටින දශ ලක්ෂ 450 ක් වූ ග්‍රාමීය ශ්‍රම බලකායෙන්, දළ වශයෙන් දශ ලක්ෂ 140 ක් ගොවිපොළ නො වන රැකියාවල නිරත වී ඇති බව දක්නට ලැබේ (Government of China, 1998, 1999, 2000). කෙසේ වෙතත්, තවමත් ගොවි පවුල්වල අතිරික්ත ශ්‍රමය කෘෂිකාර්මික කටයුතුවලින් ඉවත් කිරීමට බාධා සමූහයක් පවතී. මෙම ශ්‍රම සංචලනය සඳහා නාගරික ආර්ථිකයේ ඇති ඉහළ ආදායම් ලැබීමේ

හා ලබා ගැනීමේ හැකියාව ඉතාමත් ආකර්ෂණීය හේතුව වී ඇත. එසේ ම රැකියා ලබා ගැනීමේ තහනම, නාගරික ව විසීමේ නේවාසික බලපත්‍ර ලබා ගැනීම, ආදිය නාගරික අංශයේ සේවා ලබා ගැනීමට පවතින බාධකයන් ය. ග්‍රාමීය අංශයේ මෙම බාධක හා සීමාකම් තරමක් අඩුවන අතර, ඉඩම් හිමිකම් හා පරිහරණ අයිතීන් හා කළමනාකරණය පිළිබඳ සංවිධාන කටයුතු, සලාක ක්‍රම ක්‍රියාත්මක වීම සහ අනෙකුත් ආයතනික සංවිධාන පද්ධතිය ඍජු ව ම, ග්‍රාමීය ගෘහස්ථ ඒකකවල රැකියා අවස්ථාවන් ලබා ගැනීම හෝ කෘෂිකර්මයෙන් ඉවත් ව නාගරික ප්‍රදේශයක ජීවත්වීම යන කරුණු තීරණය කිරීම කෙරේ බලපානු ඇත. සාමාන්‍යයෙන් පොදුවේ ගොවිපොළ නො වන රැකියාවන්, ග්‍රාමීය නාගරික ශ්‍රම සංක්‍රමණය හා සංචලනය මත සිදු වුවත්, චීනයේ මෙම කටයුත්ත නාගරික සංවර්ධනය සහ ග්‍රාමීය ව්‍යාපාරික කර්මාන්ත (Township and Village Enterprise : TVE) මත සිදු වනු ඇත ( Huang, 1996). එසේ ම ග්‍රාමීය - ග්‍රාමීය ශ්‍රම සංචලනය ඒ සඳහා උපකාරී වන විකල්ප හේතුවක් වී ඇත. පසුගිය දශකය තුළ ග්‍රාමීය ශ්‍රමිකයන් දශ ලක්ෂ ගණනින් නාගරික අංශයේ රැකියා කරා සංක්‍රමණය වූ අතර, ඉදිරි දශකයේ දී මෙම ශ්‍රම සංක්‍රමණය එතරම් වැදගත් සංවර්ධන විකල්පයක් නො වන්නේ, රාජ්‍ය අංශය සතු කර්මාන්ත 'ප්‍රතිව්‍යුහගත කිරීමත්' ඒවායේ රැකියා අවස්ථාවන් පිළිබඳ නැවත කරනු ලබන තර්කානුකූල විශ්ලේෂණය සහ සාධාරණීකරණයත් යන කරුණු නිසා ය. නාගරික අංශයේ නව රැකියා ඉඩ ප්‍රස්ථාවන් ලබාදීමේ දී, නාගරික කර්මාන්ත අංශයේ ඇති 'අතිරික්ත ශ්‍රම බලකාය' සඳහා ප්‍රමුඛතාවය ලබාදෙන අතර, ග්‍රාමීය අංශයේ රැකියා සොයන්නන් සඳහා, නාගරික ප්‍රදේශවල ග්‍රාමීය නො වන රැකියා අවස්ථාවන් ලබා ගැනීම ඉතා දුෂ්කර කාර්යයක් වී ඇත. කෘෂිකාර්මික නො වන ශ්‍රම සංක්‍රමණිකයන් සඳහා ග්‍රාමීය කර්මාන්තවල, රැකියා ඇති කිරීමේ වැදගත් කාර්යභාරයක් ඉටු කළ යුතු ය. ගොවිපොළ නො වන ශ්‍රම වෙළඳපොළ සඳහා ඉතා වේගවත් වර්ධනයක් ලබා දෙන්නේ ග්‍රාමීය කර්මාන්ත මගින් ය. කෙසේ නමුත් කෘෂි අංශයේ අඛණ්ඩ ව සිදු වන ශ්‍රම සංචලනය හේතු කොටගෙන එම අංශයේ ඉතිරි ව පවතින අමතර ඉඩම්. ජලය, ප්‍රාග්ධනය සහ ශ්‍රමය යෙදවීමෙන් ආදායම් වර්ධනයක් වී ඇත. කෘෂිකාර්මික අංශයේ තීරණාත්මක සාධකයක් වන ඉඩම් හා ශ්‍රම අනුපාතයේ වර්ධනය, එම අංශයේ අනාගත ආදායම් මට්ටම වැඩි කිරීමට හේතු වනු ඇත. විශේෂයෙන් ම ජල සම්පත් සංවර්ධනය හා සංරක්ෂණ ව්‍යාපාරය ද ණය දෙන ආයතනික සංවිධාන රටාවේ කරන ලද ප්‍රතිසංස්කරණයන් ද නිසා වාරිමාර්ග පහසුකම් සහ ප්‍රාග්ධනය ලබා ගැනීමේ හැකියාව ද වැඩි වී ඇත. කෙසේ වුව ද, ඉවත් කර තබා ගත යුතු නාගරික අංශයේ ශ්‍රම බලකාය නගරය තහනම් ග්‍රාමීය ශ්‍රම සංක්‍රමණිකයන් සමග නිරන්තර ගැටුම් ඇතිවිය. එබැවින්, ග්‍රාමීය කර්මාන්ත පුළුල් හා කාර්යක්ෂම කරන ප්‍රතිපත්ති සමුදයක් චීනය විසින් වර්ධනය කර ගනු ලැබී ය.

# 9. කෘෂිකාර්මික ඵලදයීතාවය - ආධාරක ප්‍රතිපත්තීන් සහ ආයෝජන

## 9.1 නිෂ්පාදන සාධක ඵලදයීතාවය තංවාලීම : කෘෂි පර්යේෂණ හා ව්‍යාප්ති සේවාවන්

ඓතිහාසික වශයෙන් ම, චීනයේ රාජ්‍ය කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතිය විසින් කෘෂිකාර්මික අංශයේ සංවර්ධනය සඳහා අතිවිශාල දායකත්වයක් ලබා දී ඇත. නව තාක්ෂණික ක්‍රම හා නව භෝග වර්ග හඳුන්වාදීමත්, වැඩි දියුණු කරන ලද වගා ශිල්පීය ක්‍රම හඳුන්වාදීමත් යන කරුණු මුල් කරගෙන සකස් වී ඇති කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතිය මගින් චීන කෘෂිකාර්මික ඵලදයීතාවය වර්ධනය කර ඇත. එමෙන් ම නිෂ්පාදන සීමාවන් වඩාත් පුළුල් කර ඇති අතර, දිගුකාලීන නිෂ්පාදන පිරිවැය (long-term cost of production) අඩු කරමින් ග්‍රාමීය ගොවීන්ගේ ආදායම වර්ධනය කර ඇත. ආර්ථික වර්ධන හා සංවර්ධනය පිළිබඳ සංඛ්‍යා ලේඛන විශ්ලේෂණයන්ට අනුව, පසුගිය දශකය තුළ භෝග නිෂ්පාදනය සඳහා සම්බන්ධ පර්යේෂණ ආයෝජන වියදම් අඩු කර ඇත. තව ද, අවාසනාවකට මෙන් කෘෂිකාර්මික පර්යේෂණ සඳහා ආයෝජන වියදම් මූල්‍ය වශයෙන් අඩු වී ඇති අතර, එම ආයෝජන වියදම් අඩුවීම දළ ජාතික නිෂ්පාදිතයේ කෘෂිකාර්මික වියදම්වල ප්‍රතිශතයක් ලෙසට සංවර්ධනය වෙමින් පවතින රටවල සාමාන්‍ය කෘෂි ආයෝජන වියදම් ප්‍රමාණයට වඩා අඩු වී ඇත (Chuanmin, *et al*, 2000). මෙය දිගුකාලීන කෘෂිකාර්මික වර්ධනය කෙරේ දැඩි අවධානය යොමු කළ යුතු කරුණක් වී ඇත. එබැවින් වැඩි කාර්යක්ෂමතාවය සහ නව තාක්ෂණික ශිල්පීය ක්‍රමයන්ගෙන් තොර නිෂ්පාදන පද්ධතියක් පවත්වාගෙන යෑමෙන් හා නව තාක්ෂණවේදයන් ලබා ගැනීමට නො හැකි වීම මගින් චීනයේ ගොවියන්ට සිදුවන අවාසි ප්‍රමාණය ඉමහත් ය. එමගින් කෘෂි නිෂ්පාදන සඳහා ජාත්‍යන්තර වෙළඳපොලේ ඇතිවන තරඟයට මුහුණපෑමට චීන ගොවීන්ට නො හැකි වනු ඇත (Chuanmin, *et al,* 2000).

මෙම තරඟකාරී තත්ත්වයන්ට මුහුණදීම සඳහා චීන රජය විකල්ප යෝජනාවන් රැසක් ඇති කරගෙන ඇත. එම යෝජනාවන් ප්‍රධාන වශයෙන් මෙසේ සංක්ෂිප්ත කර දැක්විය හැකි ය (Zhang, 2001).

1. කෘෂිකාර්මික අංශයේ පර්යේෂණ සඳහා වැය කරන රාජ්‍ය වියදම් වැඩි කිරීම සහ කෘෂිකාර්මික අංශයේ නවීන කෘෂි තාක්ෂණික ශිල්ප ක්‍රම සහිත යෝග්‍ය හා අඛණ්ඩ ව සිදු කළ හැකි ප්‍රධාන තාක්ෂණික ව්‍යාප්ති සේවාවන් සංවර්ධනය කිරීම හා ආරම්භ කිරීම.

2. නව කෘෂි තාක්ෂණික පර්යේෂණ අධ්‍යයනය සඳහා දේශීය පෞද්ගලික අංශයේ ආයෝජන ධෛර්යමත් කිරීම.

3. නව තාක්ෂණික ශිල්පීය ක්‍රමවේදයන් දේශීය වෙළෙඳපොළට හඳුන්වාදීම සඳහා විදේශීය කර්මාන්තකරුවන්ට අවශ්‍ය දිරිගැන්වීම් සහිත පාදක ව්‍යුහමය පහසුකම් ලබාදීම.

4. අවම මට්ටමේ ආනයන තීරු බදු හා වෙනත් නීතිමය බාධක සහිත ක්‍රම යටතේ වෙනත් රටවල නිෂ්පාදිත වඩාත් දියුණු 'තාක්ෂණික ඥානය' ආනයනය කර බෙද හැරීම හා සංවිධානය දිරිමත් කිරීම.

මෙම සියළු ක්‍රියාමාර්ගයන් එක් ව අනුගමනය කිරීමෙන්, වඩාත් කාර්යක්ෂම ක්‍රියාවලියක් ආරම්භ කළ හැකි ය. ඒ සඳහා ප්‍රථමයෙන් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සපයන පර්යේෂණ අවස්ථාවන් සඳහා මූලික ප්‍රමුඛතාවයන් හඳුනාගත යුතු ය. රජය විසින් සහතික කරනු ලැබිය යුතු අතර ම පොදු භාණ්ඩ සඳහා ඇති අවශ්‍යතාවන්ට යොමු කළ යුතු ය. මෙහි දී ඇති විශේෂිත කාරණය නම්, පර්යේෂණ අධ්‍යයනයන්ගේ ප්‍රතිඵල ලැබීමට ඉතා දිගුකාලයක් ගත වන බැවින්, එම පර්යේෂණවල වාසි-ප්‍රයෝජන ක්ෂණික ව ලබා ගැනීමට නො හැකි වීම යි. එබැවින් මෙවැනි පර්යේෂණ සඳහා පෞද්ගලික අංශයේ දයකත්වයක් නො ලැබෙනු ඇත. මේ නිසා යැපුම් මට්ටමේ කෘෂි භාණ්ඩ සඳහා සම්පත් හිඟ, දරිද්‍රතාවයෙන් පෙළෙන ප්‍රදේශවල හා ස්වභාවික සම්පත් කළමනාකරණය වැනි විෂය ක්ෂේත්‍රයන් හි මෙම පර්යේෂණ සඳහා පෞද්ගලික අංශය දයක නො වනු ඇත.

ඉතා විශාල ප්‍රමාණයෙන් යුතු මූල්‍ය සම්පත් දිගින් දිගට ම, කෘෂිකාර්මික උප අංශයක් වන 'ධාන්‍ය නිෂ්පාදනය' වෙත යොමු කර ඇත. මෙම මූල්‍ය සම්පත් මූලික වශයෙන් යොමු වී තිබුණේ ගබඩා කිරීමේ පහසුකම් වැඩි දියුණු කිරීමටත්, තොග මිල දී ගැනීම හා පාලනයටත්, ගොවීන්ට මූල්‍ය සහනාධාර ලබාදීමටත් ය. මෙහි දී 'නව ආයෝජන' සඳහා මූල්‍ය සම්පත් නො යෙදූ බැවින් ඉහත කී මූල්‍ය ආයෝජන, ආර්ථික වර්ධනයක්' බහු අදියර ආයෝජන ගුණකයක් ලෙසින් කිසිදු බලපෑමක්, සිදු කර නැත. මෙම මූල්‍ය සම්පත් නැවත බෙද හැරීම තුළින්, කෘෂිකාර්මික පර්යේෂණයන් දිගුකාලීන ව යහපත් ප්‍රතිඵල සහිත ව දිගුකාලීන ආර්ථික වර්ධනයක් ලබා ගනු ඇත. කෙසේ වුව ද මූල්‍ය- සම්පත් නැවත ප්‍රති ව්‍යුහගත කිරීම මත සිදු කරන ලද විවිධ ක්‍රියාමාර්ගයන් හේතු කොටගෙන දනට පවතින 'පර්යේෂණ අරමුදල්වල' කාර්යක්ෂමතාවය තරමක් වැඩි වී ඇත. ඒ අනුව, පර්යේෂණ සඳහා මූල්‍ය ප්‍රතිපාදන වැඩි කර ඇති අතර, රාජ්‍ය නො වන අංශවල කෘෂි පර්යේෂණ සඳහා මූල්‍ය සම්පත් ලබා ගැනීමේ හැකියාව ඉහළ ගොස් ඇත. ඉතාමත් වැදගත් පර්යේෂණ අධ්‍යයන ක්ෂේත්‍රයන් සඳහා රාජ්‍ය තරඟකාරී මූල්‍ය ප්‍රදනයන් ලබාදීමේ ක්‍රම හඳුන්වා දිය යුතු අතර, ඒවා සඳහා පූර්ණ විනිවිදභාවයක් තිබිය යුතු අතර පුළුල් ප්‍රචාරණයකින් යුතු ව ජනතාව දනුවත් කළ යුතු ය. එසේ ම මෙම පර්යේෂණ අධ්‍යයන ක්ෂේත්‍රයන් සඳහා ඉතාමත් ඉහළ අධ්‍යයන කාර්ය මණ්ඩලයක් තෝරා ගත යුතු ය. තව ද කෘෂිකාර්මික පර්යේෂණ සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් වැඩි දියුණු කිරීමට රජය විසින් කෘෂිකාර්මික භාණ්ඩ සඳහා අමතර බද්දක් (ceses on agricultural commodities) පනවනු ලැබී ය. ඒ සඳහා කපු, දුම්කොළ හා තේ ඉතා සුදුසු වනු ඇත. ඒ සඳහා ඉතා සුදුසු වනුයේ පරිපාලන වශයෙන් එකතු කිරීමේ මධ්‍යස්ථානය ලෙස අපනයනය කරන ලබනු වරාය යි (Zhang, 2001). තව ද බුද්ධිමය දේපළ පිළිබඳ අයිතිය මනාව හඳුන්වාදීමෙන් සහ ආරක්ෂාව සහ බලපත්‍ර ලබාදීම මගින් පර්යේෂණ අයිතීන් තහවුරු කළ පසු පර්යේෂණ ආයතනවල වාණිජමය අපේක්ෂාවන් කරන පර්යේෂණ තවදුරටත් නො පවතිනු ඇත. කෙසේ වුව ද ඉතා කෙටිකාලීන ව

පර්යේෂණ ආයතන සඳහා ඉතා සමාන මට්ටමේ මූල්‍ය ප්‍රතිපාදන ලබාදීමට කටයුතු කිරීම හා ආයතනවල ණය වැඩසටහන් මූල්‍ය ප්‍රතිපාදන ගැලපීමේ දී, එම ආයතනවල වාණිජ ඉපැයීම් ගැන සැලකිලිමත් වීම ද කළ යුතු ය. එහිදී වඩාත් වැදගත් වනුයේ, ස්වභාවික මූල්‍ය ප්‍රතිපාදන අඩු කිරීමට වඩා, එම පර්යේෂණ වැඩසටහන් තව තවත් ශක්තිමත් කිරීම ය. චීනය දනට ජාත්‍යන්තර පර්යේෂණ ආයතන සහ මධ්‍යස්ථාන කීපයක් සමඟ තම සහයෝගීතාවය පවත්වාගෙන යයි. පවත්නා සහයෝගීතාවය හා අන්තර් කටයුතු, ජාත්‍යන්තර මෙන් ම ජාතික වශයෙන් පුළුල් කළ යුතු අතර නව පර්යේෂණ මධ්‍යස්ථානයන් බිහි කළ යුතු ය. ඒවායේ කටයුතු සත්ව පාලනය මෙන් ම භෝග වගාවන් වියළි ශුෂ්ක තිසරු ප්‍රදේශ කරා ව්‍යාප්ත කළ යුතු ව ඇත. එමගින් ග්‍රාමීය දරිද්‍රතාවයෙන් යුක්ත ප්‍රදේශ කරා ළඟා වෙමින් චීනයේ ගොවීන් සඳහා තාක්‍ෂණය ලබා ගැනීමේ හැකියාව වර්ධනය කළ හැකි ය.

කෘෂිකර්ම ව්‍යාප්ති සේවය ඉතා දැඩි මූල්‍ය සම්පත් හිඟයකට මෙන් ම, පුහුණු සේවක හිඟයකට හා දක්‍ෂතාවයන්ගේ ඌනතාවයකට පත් ව ඇත. මූල්‍ය සම්පත් හිඟය ප්‍රධාන වශයෙන් ම ක්‍ෂේත්‍ර නිලධාරීන්ගේ හිඟයක් මවා ඇත. මේ නිසා පවතින කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය පුහුණු වැඩසටහන් වර්ධනය කළ යුතු අතර. නව පුහුණු දක්‍ෂතාවයන් අත්කර ගත යුතු ය. ඒවා විශේෂයෙන් ම, සාම්ප්‍රදායී නො වන කෘෂි නිෂ්පාදන සඳහා විය යුතු ය. තව ද, ඒවා නව වගා ක්‍රමවේදයන් පිළිබඳ හා වෙළෙඳපොළ පිළිබඳ ගැටළු නිරාකරණය කිරීමට නැඹුරු වූ පර්යේෂණ අධ්‍යයනයන් විය යුතු ය. කෘෂිකාර්මික අංශයේ පවතින අධික වූ සුළු පරිමාණ ගොවිපොළ ඒකක නිසා ම, චීනය විසින් රාජ්‍ය කෘෂි ව්‍යාප්ති සේවයක් පවත්වා ගනු ලැබිය යුතු ය. කෘෂිකාර්මික පර්යේෂණ සම්බන්ධ ඇතැම් කටයුතු පෞද්ගලික අංශයේ සමාගම් මගින් ද ඉටු කර ගත හැක්කේ, පෞද්ගලික අංශයට කෘෂි වෙළෙඳපොළට මැදිහත්වීමට රජය විසින් ලබා දෙන ඉඩ ප්‍රමාණය මත ය. මේ කටයුතු සඳහා නව බීජ වර්ග හඳුන්වාදීම, කෘමීන් පාලනය, කෘෂි රසායනික ද්‍රව්‍ය පාලනය, රසායනික පොහොර සහ කෘෂි නිෂ්පාදනවල තත්ත්වයන් සහ ගුණය පිළිබඳ සම්මත ප්‍රමිතීන් පවත්වාගෙන යෑම වැනි කටයුතු ඇති කළ යුතුය (Zhang, 2001).

## 9.2 කෘෂිකර්මය තුළ සෘජු විදේශීය ආයෝජන

විදේශීය ආයෝජන අතිවිශාල ලෙස ලබා ගැනීමෙහි ලා, චීනය අතිශයින් ම සාර්ථක රටක් විය. මෙහි දී විශේෂයෙන් ම ශ්‍රම සූක්‍ෂම කර්මාන්ත ඉතා වැදගත් වන්නේ එමගින් නව රැකියා අවස්ථාවන් රාශියක් ජනිත කළ හැකි නිසා ය. කෙසේ වෙතත් 1990 පමණ වන විට කෘෂිකාර්මික හා කෘෂි නිෂ්පාදන ආශ්‍රිත ව කෙරෙන ආයෝජන සඳහා ලැබුණේ මුළු විදේශීය ආයෝජනවලින් සියයට 4ක් පමණ ප්‍රමාණයකි (World Bank, 2001). සෘජු විදේශීය ආයෝජන විශේෂයෙන්, තාක්‍ෂණික සූක්‍ෂම කෘෂිකර්මාන්තයන් වූ බීජ නිෂ්පාදනය, කෘෂි රසායනික ද්‍රව්‍ය සහ සියළු නිෂ්පාදනයන් සඳහා අවශ්‍ය ඖෂධ වර්ග සහ කෘෂි යාන්ත්‍රික උපකරණ නිෂ්පාදනය ආදිය සඳහා යොදා ගත හැකි අතර, එහි පවතින විශාල ධාරිතාවය, කෘෂිකාර්මික නවීකරණය සඳහා ඉතා වැදගත් වේ. මෙම පර්යේෂණ ක්‍රම පද්ධතිය අතිරේක

වශයෙන් හෝ ආදේශක වශයෙන් දනට පවතින පර්යේෂණ ක්‍රමවේදයන් හා අනුගත විය යුතු ය. එබැවින්, කෘෂි අංශයේ පවතින වර්ධන හැකියාව හා ධාරිතාවය භාවිතා කිරීමට රජය විසින් විදේශීය ආයෝජන ලබා ගැනීමට කටයුතු කරනු ලැබී ය. එසේ ම ඒවා රසායනික පොහොර තාක්ෂණික-සූක්ෂම කර්මාන්තය වැනි හා ප්‍රාග්ධන-සූක්ෂම කර්මාන්ත සඳහා යෙදවිය යුතු වේ.

තවද, රජය විසින් 'බුද්ධිමය දේපළ පිළිබඳ අයිතිය' සම්බන්ධයෙන් නීති රීති සම්පාදනය හා නීතිමය ආරක්ෂාව දුප්පතුන් සඳහා ලබා දී ඇත. එසේ වුවද චීනයේ විශාල වෙළෙඳපොළ ශක්‍යතාවයක් ඇති නව තාක්ෂණික යෙදවුම් සඳහා පෞද්ගලික අංශයේ ආයෝජන සැලකිය යුතු පරිදි ආකර්ෂණීය කරගැනීමට සමත් වී ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස බහු ජාතික සමාගම් විසින් නිෂ්පාදනය කර සංවර්ධනය කරන ලද නව තාක්ෂණික යෙදවුම් චීන ගොවි ජනතාව වෙත මූලික ව ලබා ගැනීමේ හැකියාව ඉතා දුෂ්කර වී ඇත්තේ, එම තාක්ෂණික මෙවලම්වල ඇති 'දේපළ අයිතිය' පිළිබඳ තාක්ෂණික ආරක්ෂාව යි. බහු ජාතික සමාගම් විසින් මෙම 'ආරක්ෂිත තාක්ෂණික ශිල්ප ක්‍රම' සංවර්ධනය සඳහා ලබා දෙන්නේ නම්. චීනය අනිවාර්යයෙන් ම මෑතකාලීන ව සකස් කළ තම ජාත්‍යන්තර බුද්ධිමය දේපල අයිතිය පිළිබඳ නීතිරීති නැවත සකසා පැනවිය යුතු ය. මෙයට අමතර ව බහු ජාතික සමාගම්, නිල වශයෙන් පෙන්වා දෙනුයේ මේ සඳහා පවතින දුර්වල නීතිමය පරිසරය යි. විනිවිදභාවයෙන් හා විධිමත්භාවයෙන් තොර විදේශීය ආයෝජන ප්‍රතිපත්ති සහ තාක්ෂණික ආයෝජන හා ප්‍රාග්ධන-සූක්ෂම කර්මාන්ත සඳහා ඇති තොග හා සිල්ලර වෙළෙඳපොළේ සම්බන්ධතාවයන් බිඳ වැටීම ද මේ සඳහා බලපාන ප්‍රධාන සංසිද්ධීන් දෙකක් ලෙසට පෙන්වා දෙනු ලැබේ. මේ නිසා 'නව දිරිගැන්වීම්' ක්‍රම හඳුන්වා දිය යුතු අතර, ආයෝජන නැවත උනන්දු කරවා එමගින් අලෙවිකරණ හා බෙදා හැරීමේ විවිධ ගැටළු නැවත විසඳිය යුතු යි (Huang and Rozelle, 2001).

## 10. ස්වභාවික සම්පත් සංවර්ධනය සහ නිෂ්පාදන යෙදවුම් පරිහරණය

### 10.1 අනාගත ඵලදයීතාවය තැංවීමේ ප්‍රධාන සංරෝධකයක් ලෙස, ජලය සහ එහි භාවිතය

අතිවිශාල ශ්‍රම සම්පතක් චීනය සතු වුව ද අනෙකුත් නිෂ්පාදන සාධකවල ඇත්තේ කෙටිකාලීන සැපයුමකි. කෘෂිකාර්මික සම්පත් සම්බන්ධයෙන්, කෘෂි නිෂ්පාදන සඳහා ඉතාමත්ම සීමාකාරී සාධකය වන්නේ ජලය යි. ජල සම්පත සීමාවීම විශේෂයෙන් ම උතුරු චීනයේ ඇතැම් ප්‍රදේශ සඳහා ඉතාමත් දැඩි ව බලපා ඇත. එබැවින් මෙම ජල හිඟය පිළිබඳ ගැටළුව මූළුමණින් ම තුරන් කරලීම සඳහා චීන රජය විසින් ජල සම්පත් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති සිය ගණනක් හඳුනා ගනු ලැබ ඇත. ආර්ථික ප්‍රතිසංස්කරණයන් හඳුන්වා දුන් ආරම්භක සමයේ සිට චීනය අතිවිශාල මූල්‍ය සම්පත් ප්‍රමාණයක් තම ජල සම්පත් සංවර්ධනයට හා සංරක්ෂණයට ආයෝජනය කර තිබියදීත්, ජලය ලබා ගැනීමේ හැකියාව 1980 වර්ෂයට සාපේක්ෂ ව 1993 දී අඩු වී ඇත. බොහෝ නිෂ්පාදිත අංශවල ජල අවශ්‍යතාවයන් සපුරාලීමට නො හැකි ව තිබියදීත් තවත් සමහර අංශවල ජලය සම්බන්ධ ව ඉහළ ඵලදයීතාවයක් දක්නට ඇත. එබැවින් නව ජල සම්පත් සංවර්ධනය බෙදා හැරීම, දියුණු කිරීම හා

කාර්යක්ෂම ජලය භාවිතා කිරීමත් යන කරුණු සඳහා විශාල මූල්‍ය ආයෝජන ප්‍රමාණයක් යෙදිය යුත්තේ කෘෂිකාර්මික නිෂ්පාදනවල සැපයුම් මාර්ගයන් අඛණ්ඩ ව නඩත්තු කළ යුතු බැවිනි. ඉතාමත් පහසුවෙන් කළ හැකි නව ජලය සැපයීමේ මාර්ගයක් වනුයේ, ජලය බහුල දකුණු ප්‍රදේශයෙන්, ජලය හිඟ උතුරු ප්‍රදේශය කරා හරවා මාරු කර යැවීම යි. උතුරේ බොහෝ ප්‍රදේශවල මතු පිට ජල තලය මෙන් ම භූගත ජල තලය ද අධි පාරිභෝජනයට ලක්ව ඇත. එබැවින් චීනය අනිවාර්යයෙන් ම දකුණින්-උතුර කරා විහිදී යන ජල මාර්ග එකක් හෝ කීපයක් ආරම්භ කළ යුතු ව ඇත. කෙසේ වෙතත්, ඒ සඳහා අධික පිරිවැයක් මෙන් ම විශාල කාලයක් වැය වනු ඇත.

දකුණු ප්‍රදේශයෙන්, උතුරු ප්‍රදේශය කරා ජලය හරවා යැවීමේ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම මෙම ජල හිඟය මඟහැරීමට දයක වන ප්‍රධාන හේතුව වනු ඇත. දිගුකාලීන ව මෙම ජල සම්පත් හා සැපයුම් මාර්ග සංවර්ධනය නො කළ හොත්, එම ප්‍රදේශවලට ලැබෙන ජල පරිමාව දිගින් දිගට ම අඩු විය හැකි අතර, එමගින් උතුරු චීන තැනිතලාවේ භූගත ජල මට්ටම ද අධි පාරිභෝජනය හේතු කොටගෙන අඩු විය හැකි ය. මේ නිසා වාරි මාර්ග ක්‍රමවල කාර්යක්ෂමතාවය වර්ධනය කිරීමෙහි ලා නව ආයෝජන ව්‍යාපෘතීන් ඇති කිරීම ඉතා වැදගත් වේ. එම ව්‍යාපෘතීන් අතර, වාරි මාර්ග ක්‍රම නැවත පුනරුත්ථාපනය කිරීම මගින් බෙදා හැරීමේ කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම, නව වාරි මාර්ග ක්‍රම හා නල ජල මාර්ග ඉදි කිරීම ගොවිපළවල වඩාත් කාර්යක්ෂම ජල භාවිත ශිල්පී ක්‍රම භාවිතය සහ නව ජලය ඉතිරි කිරීමේ ක්‍රම මගින් ද මෙම කාර්යක්ෂමතාවය තවදුරටත් සංවර්ධනය කළ හැකි ය. මෙම ඉලක්ක ගත බෙදා හැරීමේ කාර්යක්ෂමතාවය පිළිබඳ ජයග්‍රහණය අත්කර ගැනීමෙන් සියයට 78 ක් වූ ජල බෙදා හැරීමට අමතර ව තවත් ජල කියුබික් මීටර් බිලියන 100 ක් නව ගොවිබිම් කරා යොමු කළ හැකි අතර, එමගින් ගොවීන්ගේ ආදායම හා නිෂ්පාදනය අති විශාල ප්‍රමාණයකින් වැඩි කළ හැකි ය (Huang and Rozelle, 2001).

මේ සඳහා මූල්‍ය සම්පත් පිළිබඳ සංරෝධකයන් ඇතුළත් කිරීමෙන් පෙනී යන්නේ, මෙම ජලාශ හා ජල මාර්ගවල නඩත්තු කිරීමේ පිරිවැය ක්‍රියාකාරීත්වය හා පාලනය, කළමනාකරණය හා පරිපාලනය ආදිය ගොවීන් විසින් දැරිය යුතු බව ය. එය ගොවීන් විසින් මෙහෙයවිය යුතු බව ය. ඇතැම් සාර්ථක නියමු ව්‍යාපෘතීන් මගින් පෙන්නුම් කරන්නේ, මෙවැනි රාජ්‍ය අනුග්‍රහය යටතේ ඇති ජල කළමනාකරණ පද්ධතීන් ස්වයං මූල්‍ය හැකියාවන් ඇති නව ආයතනයට පරිවර්තනය කළ හැකි බව යි. මේ සඳහා නව ආයතනයක් ආරම්භ කර 'ආයතනික කළමනාකරුවෙකු' ඉතා ඉක්මණින් පුහුණු කළ යුතු ය. කෙසේ වෙතත් ජල සංරක්ෂණය සඳහා ඉතා කුඩා පරිමාණයේ දිරි ගැන්වීම්, දිරි දීමනාවන් ඇති කර ඇති බැවින් ගොවීන් මෙම භෝග නිෂ්පාදන රටාවන් ආශ්‍රිත ව අඩු පිරිවැයකින් ජල භාවිතයටත්, අනවශ්‍ය ජල භාවිතයෙන් වැළැකීමටත් පුරුදු වී ඇත. එබැවින් ජල සම්පත් සංරක්ෂණය කිරීමටත්, ගොවිපොළ මට්ටමේ ජල කාර්යක්ෂමතාවයක් ඇති කිරීමටත්, රජය විධිමත් හා කාර්යක්ෂම පියවර කඩිනමින් ගත යුතු ව ඇත. ඒ සඳහා නියමිත ජල පරිමාව මත අය කරන මුළු පිරිවැය ගාස්තු ක්‍රියාත්මක කළ යුතු ව ඇත. මේ නිසා ජලය සඳහා

මිලක් නියම කිරීමේ යෝජනා ක්‍රමයක් අනිවාර්යයෙන්ම ආරම්භ කිරීමට චීනයට සිදු වී ඇත (World Bank, 1999).

මෙයට අමතර ව ස්වභාවික හා අත්හරින ලද ජල සම්පත් පාලනය, දකුණු චීනයේ ජල කළමනාකරණය තුළ ප්‍රධාන ගැටළුවක් වී ඇත. මේ නිසා 'ගංවතුර පාලනය' ආයෝජන සැලසුම්වල අනිවාර්යය කොටසක් වී ඇති අතර, චීනය අනිවාර්යයෙන් ම අතිරේක පැහැදිලි අවධානයක් තම ජල පෝෂක ප්‍රදේශ කළමනාකරණය වෙත යොමු කළ යුතු ව ඇත.

## 10.2 ඉඩම් සම්පත් හා ඉඩම් පරිහරණය කිරීමේ අයිතීන්

දළ වශයෙන් චීනයේ සෑම ගොවි ඒකකයක් සඳහා ම ඉඩම් පිළිබඳ හිමිකමක් ඇත. නීතිමය ක්‍රමයට, ඉඩම් හිමිකම ගම්වාසී ගොවීන්ට හෝ සාමූහික නිෂ්පාදන කණ්ඩායම්වලට ලැබුණු අතර, එසේ නොමැති නම්, ඉඩම් පරිහරණය කිරීමේ හෝ භුක්ති විඳීමේ අයිතිය ග්‍රාමීය ගෘහස්ථ ඒකකවලට ලබා දී තිබිණි. මෑත කාලයේ දී මධ්‍යම රජය විසින් ඉඩම් ලබා දී ඇති ගොවීන්ගේ පරිහරණ හෝ භුක්ති විඳීමේ අද කාල සීමාව අවුරුදු 15 සිට 30 දක්වා වැඩි කරන ලදී (Huang and Ma, 2000). ඉඩම් පරිහරණය දක්වා සිටින මෙම ගිවිසුම් අයිතිය එසේ වුවත්, බොහෝ ග්‍රාමීය ගොවීන් මෙම ප්‍රතිපත්තිය අනුගමනය කිරීමක් දක්නට නැත. ග්‍රාමීය ගෘහස්ථ ඒකකවල ඇතිවන ක්ෂණික හා කාලීන වෙනස්වීම් ද ග්‍රාමීය ජනගහනයේ සිදුවන ව්‍යූහමය වෙනස්වීම් ද, පවතින සමාජ-ආර්ථික ප්‍රතිපත්තිවල පීඩාකාරී ස්වරූපය ද, හේතු කොටගෙන දේශීය හා පළාත් පාලන බලධාරීන්ට නිතරම ගිවිසුම් ගත කාලය අවසන්වීමට ප්‍රථම නැවත බෙද හැරීමට සිදු වී තිබේ. එසේ වුවත් දිගුකාලීන ව, මෙම ගිවිසුම්ගත අද ඉඩම් ක්‍රමය හා සම්බන්ධ ව ඉතා ඉහළ ඵලදායීතාවයක් ලැබී ඇත. කෙසේ වෙතත්, බොහෝ අධ්‍යයන වාර්තා මගින් පෙන්වා දී ඇත්තේ ද, චීනයේ ගිවිසුම්ගත ඉඩම් අද ක්‍රමයෙන් කෘෂිකාර්මික නිෂ්පාදනයන්ගේ හෝ ක්‍රියාකාරීත්වය සඳහා ලැබී ඇති බලපෑම හෝ දායකත්වය ඉතාමත් අල්ප බව ය. එහෙයින් ගොවීන් සඳහා ඉඩම්වල නිත්‍ය අයිතියක් හා නීතිමය සුරක්ෂිතභාවයක් නොමැතිවීම හේතු කොටගෙන ණය ලබා ගැනීමේ දී එම ඉඩම් ඇප වශයෙන් ඉදිරිපත් කිරීමට ඔවුන්ට නො හැකි වී ඇත. මේ නිසා ණය ලබා ගැනීමේ හැකියාව සීමා වී ඇති අතර, විධිමත් ණය වෙළඳපළේ කටයුතුවලට එයින් අහිතකර බලපෑම් ඇති වී තිබේ.

චීනයේ දී නිරන්තරයෙන් ම ඉඩම් සඳහා විධිමත් බදුදීමේ වෙළෙඳපොළ සොයා ගත හැකි ය. ගෘහස්ථ ඒකක සඳහා වූ කෙටිකාලීන ඉඩම් පරිහරණ හා භාවිත අයිතීන් තවත් අයෙකුට ගාස්තු යටතේ ලබාදීම අවිධිමත් වැඩපිළිවෙළ මගින් සිදු වී ඇත. ඒ සඳහා බදු, වත්කම්, සලාක ක්‍රම, ආදිය ද ඇතුළත් විය. එසේ වුව ද මේ සඳහා වෙන්වූ ඉඩම් ප්‍රමාණය තුලනාත්මක ව ඉතා කුඩා ය. ඉඩම් බදු දීමේ දුෂ්කරතාවයට දිගින් දිගට ම මුහුණ දෙන්නට ගොවීන්ට සිදු වී ඇත. නාගරික ප්‍රදේශවලට සංක්‍රමණය වන ග්‍රාමීය ශ්‍රමිකයන් සංඛ්‍යාව ද ඉහළ ගොස් ඇති අතර ම කෘෂිකාර්මික නො වන අංශයේ රැකියා ලබා ගැනීම සඳහා වන සංඛ්‍යාව ඉහළ ගොස් ඇත. මේ නිසා ඉඩම් භාවිත කිරීමේ කාර්යක්ෂමතාවය හීන වී ඇත. පූර්ණකාලීන ගොවීන්

සඳහා අමතර ගොවිපොළ ඉඩම් ලබා ගැනීමේ යාන්ත්‍රණයන් හඳුනා ගැනීම මගින් ගොවීන්ගේ ආදායම වැඩි කළ හැකි අතර එමගින් ඉඩම්/ශ්‍රම අනුපාතය වර්ධනය කළ හැකි ය (Chang, 1985).

ඉඩම් ප්‍රතිලාභ ලබා තිබිය දී ඉඩම් පෞද්ගලීකරණය කිරීම හෝ ඉඩම් අයිතීන් වඩාත් සුරක්ෂිත කිරීමට වඩා ගොවීන් වැඩි රුචිකත්වයක් දක්වනුයේ 'සාමූහික අයිතියට' ය. තව ද ජනගහන ව්‍යුහයේ වෙනස්වීම්වලට අනුකූලව කාලීන ව සිදු කරන ඉඩම් අයිතීන් පිළිබඳ වෙනස්වීම්වලට ද සැලකිය යුතු සමාජ පිරිවැයක් දැරිය යුතු වේ. චීන ග්‍රාමීය සමාජයේ ඉඩම් සඳහා ඇති වැදගත්කම ඉතාමත් ඉහළ වන අතර, එය ඉඩම් වෙළඳපොළ පිළිබඳ පරීක්ෂණ සඳහා සුදුසු මාධ්‍යයකි. මේ නිසා ඉඩම් වෙළඳපොළ හා ඉඩම් පිළිබඳ අද ක්‍රමය, ඉඩම් අයිතිය පිළිබඳ සුරක්ෂිතභාවය සමාන ආදායම් ආයෝජන හා කාර්යක්ෂමතාවය මෙම පර්යේෂණ සඳහා ඉතා ම වැදගත් වේ.

## 11. ස්වභාවික සම්පත් භාවිතය වැඩි දියුණු කිරීම හා සම්පත් බෙද හැරීමේ කාර්යක්ෂමතාවය

### 11.1 කෘෂිකාර්මික අලෙවිකරණය

පසුගිය දශක කීපය තුළ කෘෂිකාර්මික වෙළෙඳම සියයට 50 කින් පමණ වර්ධනය වූ අතර, කෘෂිකාර්මික වෙළෙඳ ශේෂය පසුගිය වසරවල ධනාත්මක වර්ධනයක් පෙන්වීය. එහෙත් ඇතැම් වසරවල කෘෂිකාර්මික වෙළෙඳමේ වර්ධනයක් දක්නට නොවීය. කෙසේ වුව ද වෙළෙඳම පිළිබඳ ලබාගත හැකි සංඛ්‍යා ලේඛන දත්තයන් ඉතා සීමිත කෙටි කාලයක් සඳහා වූ අතර, එම කෘෂි ආනයනයන්ගේ සංයුතිය මගින් නිරූපනය වන්නේ, කෘෂි භාණ්ඩ නිෂ්පාදනය හා වෙළෙඳ රටාව තුළ සාපේක්ෂ වාසි පිරිවැය ගැබ් වී ඇති බව ය. එබැවින් අපනයන-ශ්‍රම සූක්ෂම කෘෂි නිෂ්පාදන (horti-cultural sector) සහ ආනයන-ඉඩම් සූක්ෂම, ධාන්‍ය (cereals) භෝග නිෂ්පාදනය යන දෙක ම වර්ධනය වී ඇත.

මිල ස්ථායීතාවය පිළිබඳ ඇති උනන්දුව නිසා ම රාජ්‍ය වෙළඳ සමාගම් විසින් දිගින් දිගට ම චීනයේ කෘෂි භාණ්ඩ වෙළඳපොළ පිළිබඳ 'ඒකාධිකාරී බලය' පවත්වාගෙන ගියේ ය. නමුත් ස්ථායීකරණය පිළිබඳ අරමුණු ජයග්‍රහණය කිරීම සඳහා සාධක කීපයක් එක් විය යුතු විය. මෙහි දී වෙළෙඳ කොන්දේසි වෙනස් කිරීම, අස්වැන්න නෙළීමට පෙර සැලසුම් සලාක ක්‍රම ඇති කිරීම, කාර්යක්ෂම තරඟකාරීත්වය නැති කිරීම, ස්ථායීකරණයට වඩා අස්ථායීකරණය වීම, සැපයුම් හා මිල ගණන් වෙනස්වීම ආදිය ඉතා මන්දගාමී ස්වරූපයෙන් සිදු විය. චීන ධාන්‍ය වෙළෙඳ පොලේ මිල ජාත්‍යන්තර ධාන්‍ය ආනයන/අපනයන මිල ගණන්වලට වඩා වැඩි වේගයෙන් ක්ෂණික ව වෙනස් වන බැවින් ඒ මගින් ඇති කරන ලද සැපයුම් උච්චාවචනයන් කීපයක් පසුගිය දශක කීපයේ දක්නට ලැබිණි (World Bank, 1999).

ලිබරල්-විවෘත හා තරහකාරී චීනයේ ධාන්‍ය වෙළෙඳපොළ සහ රාජ්‍යය හා රාජ්‍ය නො වන ඇතැම් වෙළඳ ව්‍යාපාරයන් ද තවමත් ක්‍රියාත්මක වන්නේ විවිධ සංරෝධකයන්ට යටත් ව ය. එසේ වුව ද විවිධ වාණිජ දිරිගැන්වීම් හා ප්‍රමිතීන් ආදිය හේතු කොටගෙන චීන වෙළඳපොළ ඉතා ඉක්මනින් ප්‍රතික්‍රියා කරන්නට විය. එම නිසා විශේෂයෙන් ම ධාන්‍ය වෙළඳපොළ තුළ අතිරික්තයක් හෝ හිඟයක් දක්නට නොවූ අතර, මනා ස්ථායීකරණයක් දක්නට විය. වෙළෙඳපොළ වඩාත් විවෘත වීම හේතු කොටගෙන සලාක ක්‍රම ඉවත් වූ අතර, බදු ක්‍රම දෙකක් බිහිවිය. සලාක ක්‍රමය තුළ සියයට 1 සිට සියයට 3 දක්වාත්, සලාක ක්‍රමයෙන් බැහැර ව සියයට 100 ක් දක්වාත් ක්‍රියාත්මක වූ බදු ක්‍රමයක් විය (Zhang, 2003). කෙසේ වුව ද, තනි බදු අනුපාතය, මගින් ගොවීන්ගේ ධාන්‍ය මිල පහළ බැසීමෙන් වන හානියෙන් ඔවුන් ආරක්‍ෂා කළ අතර, ධාන්‍ය මිල ගණන් ඉහළ යෑමෙන් පාරිභෝගිකයන්ට සිදුවන හානිය ද අවම කළ නිසා ඔවුන් අනවශ්‍ය සූරා කෑමකට ගොදුරු නොවීය (World Bank, 1999).

ලෝක වෙළෙඳ සංවිධානයේ නිර්දේශිත බදු අනුපාත ක්‍රියාත්මක කරන්නේ නම්, චීනයේ ධාන්‍ය හා තෙල් භෝග මිල ගණන්, ලෝක වෙළෙඳපොළ මිලට වඩා සියයට 60 කින් පමණ ඉහළ මට්ටමකින් තබා ගත හැකි ය. මෙවැනි ආකාරයේ බදු සීමාවන් ජාත්‍යන්තර වශයෙන් ඉතාමත් පහළ ප්‍රමිතියක පවතින අතර. චීනය මේ ආකාරයට 'අතිශයින් ම ආරක්‍ෂාකාරී' ප්‍රතිපත්තියක් තම දකුණු ආසියාතික රටවල් සඳහා ක්‍රියාත්මක කර ඇත. මේ හේතු කොටගෙන මිල ගණන් පහළ මට්ටමක පවත්වා ගැනීම මගින් බොහෝ තෙල් භෝග (oil seed) නිෂ්පාදකයින්ට සැලකිය යුතු වාසි ප්‍රයෝජන අත් වී ඇත. චීනය වැඩි වශයෙන් ම පාරිභෝගික සුබසාධනය ලබාදීම අරමුණු කරන්නේ නම්, ඒ සඳහා අඩු මට්ටමේ තීරු බදු අනුපාත ක්‍රියාත්මක කිරීමත්, අතැම් භෝග වර්ග නිෂ්පාදනය ආකර්ෂණීය නො වන මට්ටමට පත් කිරීමත්, නිෂ්පාදන සම්පත් ඵලදායීතාවයෙන් යුතු, විකල්ප වාසි සහ වාණිජ වටිනාකමක් ඇති වෙනත් කෘෂි භෝග නිෂ්පාදනය කෙරේ යොමු කිරීමත් සිදු කළ යුතු ය. මෙමගින් දිගුකාලීන සමාජ සුබසාධනය වර්ධනය වන අතර, එය නිෂ්පාදකයාට මෙන් ම පාරිභෝගිකයාට ද එක් සේ ප්‍රයෝජනවත් වනු අත. මේ අතර බොහෝ ප්‍රදේශවල දුප්පත් ග්‍රාමීය ජන කණ්ඩායම්වල ප්‍රධාන ආහාර ද්‍රව්‍ය සම්බන්ධයෙන් ස්වයංපෝෂිත බවක් දක්නට නැත. ඉහළ ආනයන තීරුබදු අනුපාතයක් මගින් මෙම ජන කණ්ඩායම්වල 'ආහාර වියදම' තවතවත් වැඩි කර ඇත. එසේ ම විවෘත ආර්ථික හා වෙළෙඳ ප්‍රතිපත්තිමය නීති රීති මගින් බොහෝ විශේෂිත ධාන්‍ය නිෂ්පාදකයන්ට විවිධ බාධක පමුණුවා ඇත. මේ නිසා ද ඉහත කී දරිද්‍රතාවයෙන් පෙළෙන ජන කණ්ඩායම්වලින් කොටසක් තවමත් සාපේක්‍ෂ දරිද්‍රතාවයෙන් පෙළෙනු ඇත (World Bank, 1999). වැඩි වශයෙන් ඉතිරි කිරීමේ ප්‍රතිඵලයක් ලෙස අඩු ධාන්‍ය තොග ඇති විය හැකි බැවින් එවැනි කණ්ඩායම් නැවත නිෂ්පාදනය කරා යොමු කළ යුතු ය. මෙම ජන කණ්ඩායම් විවෘත ආර්ථික හා වෙළෙඳ ප්‍රතිපත්තිවල දැඩි බලපෑමට ගොදුරු වූවන් ලෙස හඳුනා ගත හැකි ය. ධාන්‍ය සලාක හා තොග ක්‍රම නවතා දැමීම නිසා, ආර්ථික වර්ධනය හා නිෂ්පාදන තෝරා ගැනීමේ අයිතිය ලබා දීම සම්පත් ලබා ගැනීමේ හැකියාව වර්ධනය වීම සහ පවතින මිල මට්ටම ද, මෙම ආර්ථික වර්ධනය ඉහළ යෑම හා ආදයම් වැඩිවීම කෙරේ සෘජු ව දයක වී ඇත.

## 11.2 ආහාර සුරක්ෂිතභාවය පිළිබඳ ඇගයීමක්

ජාතික සංවර්ධන අරමුණු ඉතාමත් කාර්යක්ෂම පරිදි ක්‍රියාත්මක කිරීමට නම්, එම අරමුණු අතර තුලනාත්මක බවක් මෙන් ම අන්‍යෝන්‍ය වශයෙන් ගැළපෙන බවක් තිබිය යුතු ය. විශේෂයෙන් ම මෙය අදාළ වන්නේ සියයට 95 කින් පමණ ධාන්‍ය ස්වයංපෝෂිතභාවයට පත් වීමත් සමග ම ඇති වන විශාල ආරක්ෂිත ධාන්‍ය තොග පාලනය සහ දරිද්‍රතාවය අඩු කිරීමත්, නිෂ්පාදන හා බෙදා හැරීමේ කාර්යක්ෂමතාවයත් සමග ය. මන්ද යත්, අතිවිශාල ධන සම්භාරයක් ජාතික හා පළාත් ආණ්ඩු මගින් මේ සඳහා වැය කර ඇති බැවිනි. මූල්‍යමය විශ්ලේෂණයන් යටතේ ආහාර සුරක්ෂිතභාවය ඇගැයීමට භාජනය කරන්නේ නම්, දේශීය මෙන් ම විදේශීය වෙළෙඳපොළ කෙරේ වැඩි අවධානයක් හා විශ්වාසයක් තැබිය යුතු අතර ම, කාර්යක්ෂමතාවය හා ආහාර පිළිබඳ සුරක්ෂිතතාවය යන උභය අරමුණු හා අභිමතාර්ථයන් ද සැලකිල්ලට ගත යුතු ය.

මූල්‍ය විශ්ලේෂණයන් යටතේ චීනයේ ආහාර සුරක්ෂිතභාවය ඉතා ඉහළ මට්ටමකට පත් වී ඇත්තේ චීනය සතු ව පවතින අතිවිශාල විදේශ වත්කම් ප්‍රමාණයත් වෙළෙඳ ශේෂයේ පවතින ඉහළ හිතකරභාවයත් නිසා ය. ධාන්‍ය සඳහා ජාත්‍යන්තර මිල ගණන් දිගුකාලීන ව අඛණ්ඩ පහළ වැටීමේ උපනතියක් ඇතත්, කෙටිකාලීන ව ඉතා හොඳ වෙළෙඳ තත්ත්වයන් ඇති වී තිබේ. ජාත්‍යන්තර ධාන්‍ය තොග ප්‍රමාණය ටොන් දශලක්ෂ 100 ඉක්මවා ගොස් ඇති අතර, ප්‍රධාන ධාන්‍ය අපනයනය කරන රටවල් ඉතා ඉක්මනින් ධාන්‍ය නිෂ්පාදනය කර විශාල තොග අපනයනය කිරීමට තරම් යෝග්‍ය තත්ත්වයට පත්ව ඇත්තේ ඉල්ලුම නිරන්තරයෙන් ම වර්ධනය වන නිසා ය. එසේ ම චීනයට ධාන්‍ය නිෂ්පාදනය සඳහා ඉතා ඉහළ මට්ටමේ පාදක ව්‍යුහමය පහසුකම් සහ රාජ්‍ය තාන්ත්‍රික හැකියාවක් ඇත. එමගින් ආරක්ෂිත තොග පාලන ක්‍රම, දේශීය වශයෙන් අලෙවිකරණ උපාය මාර්ග ලෙස යොදා ගත හැකි ය. දේශීය මිල ගණන් ආනයන තොග මිල ගණන්වලින් ආරක්ෂා කරගැනීමට මෙම ක්‍රමයන් යොදා ගත හැකි ය. මේ අනුව, ධාන්‍ය හා තෙල් භෝග වෙළෙඳම ජාත්‍යන්තර නිර්බාධීකරණයට යොමු කිරීම තුළින් එය චීනයේ කාර්යක්ෂම වෙළඳ කළමනාකරණයේ එක් විකල්පයක් බවට පත් වී ඇති අතර, ධාන්‍ය නිෂ්පාදනයේ දී සියයට 95ක ස්වයංපෝෂිතභාවයක් ලබාදීමට උදව් වී ඇත (Government of China, 2000).

## 11.3 දේශීය අලෙවිකරණය සංවර්ධනය කිරීමේ ශක්‍යතාවය

පසුගිය දශක කිහිපය තුළ සිදු කරන ලද වෙළෙඳපොළ හා මිල ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණවල බලපෑම් හේතු කොටගෙන චීන වෙළඳපොළ ලැබූ සංවර්ධනය අතිවිශාල ය. වර්තමානයේ බොහෝ ආහාර ද්‍රව්‍ය අලෙවි කරන්නේ නියමිත පිරිවැයට සමාන වෙළඳපොළ මිල ගණන්වලට ය. එසේම බොහෝ පර්යේෂණ අධ්‍යයනවල ඇති සංඛ්‍යාලේඛන විශ්ලේෂණයන් පෙන්වා සිටින්නේ ද දේශීය ධාන්‍ය වෙළඳපොළ ඉතා හොඳින් ඒකාබද්ධ වී ඇති බවත්, තරඟකාරීත්වය හා කාර්යක්ෂමතාවය ඉතා හොඳින් ක්‍රියාත්මක වන බවත් ය. පෞද්ගලික අංශයේ වෙළෙඳ සංවිධානවල දියුණුව

හා සංවර්ධනයත් සමග ම සියයට 25ක ධාන්‍ය මිල දී ගැනීමක් දනටමත් පෞද්ගලික අංශය විසින් සිදු කෙරෙන අතර ඔවුන් එමගින් වෙළෙඳපොළ මෙහෙයවනු ඇත (Huang and Rozelle, 2001).

චීනයේ දේශීය වෙළඳපොළ ඉතා ඉක්මනින් අතිවිශාල ලෙස සංවර්ධනය වී ඇතත් තවමත් බොහෝ ප්‍රතිපත්තිමය ගැටළු හා සංරෝධක රාශියක් දක්නට ඇත. මෙම ගැටළු අතර රාජ්‍ය මැදිහත්වීම අඛණ්ඩ ව සිදු වී ඇති අතර, අසම්පූර්ණ හා වෙන් කරන ලද ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, වෙළෙඳපොළ අකාර්යක්ෂමවීම නිෂ්පාදන සලාක ක්‍රම අඛණ්ඩ ව ක්‍රියාත්මක කිරීම, ධාන්‍ය තොග පවත්වාගෙන යෑම සඳහා අතිවිශාල වියදමක් දැරීම යන කරුණු ඉතා වැදගත් වේ. මේ අතර ධාන්‍ය මණ්ඩලය තුළ සිදුවන අපතේ යෑම් හා විනාශවීම් ඒ ආකාරයට ම දිගින් දිගට ම සිදුවන නිසා විශාල මූල්‍ය සහනාධාරයන් සැපයීමට සිදු වී ඇත. කෙසේ වුව ද ධාන්‍ය තොග ප්‍රමාණය අඛණ්ඩ ව වැඩිවන අතර, එම නිසා ම වියදම් අධික නඩත්තු ක්‍රම සඳහා මනා මූල්‍ය ක්‍රමයක අවශ්‍යතාවය දැන් කැපී පෙනේ. මේ නිසා රාජ්‍ය අයවැය ප්‍රතිපාදන මගින් ලබාදෙන මූල්‍ය සම්පත් හා එහි ප්‍රධාන වගකීම වනුයේ, ධාන්‍ය තොග හා ආරක්ෂිත තොග පාලනය පවත්වාගෙන යෑම ය. ඒවායේ සිදුවෙන අපතේ යෑම් හා විනාශවීම් සෘජුව ම එම තොග පාලනයට යටත්වන අතර, ඒවායේ ප්‍රමාණයන් විවිධාකාර වේ. එබැවින් චීනය ඉතාමත් ප්‍රවේශම්කාරී ලෙසට තම අමතර ධාන්‍ය තොග පාලනය ඇගයීමකට ලක් කළ යුතු අතර, අවම අවශ්‍යතාවයන් අනුව එම ඇගයීම් කළ යුතු ය. අවම පිරිවැයකට යටත්ව ඉන්දියාව හා ඉන්දුනීසියාව, තම ධාන්‍ය තොග පාලනය කිරීමෙන් මිල ස්ථායීතාවයක් ඇති කර ඇත. එසේ වුවත් එය සැලකිය යුතු පිරිවැයක් වන අතර, එම රටවල් මිලදී ගන්නේ මුළු ධාන්‍ය නිෂ්පාදන ප්‍රමාණයෙන් සියයට 20 සිට 25 දක්වා ප්‍රමාණයකි (Huang and Rozelle, 2001).

යෝජිත ධාන්‍ය නිෂ්පාදනය හා වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණයන් 1998 දී සාර්ථක ව ක්‍රියාත්මක කරන ලදී. එසේ වුවත් ඉතාමත් සංකීර්ණ වූ ප්‍රතිපත්තිමය අරමුණු පද්ධතියක් රජය විසින් සාක්ෂාත් කර ගත යුතු අතර, නිෂ්පාදන හා වෙළඳ කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම, ගොවීන්ගේ ආදයම් වර්ධනය හා ආරක්ෂා කිරීම, රජයේ අයවැය වියදම් අඩු කරලීම මේ අතර ඉතා වැදගත් වේ. කෙසේ වුවත් මූලික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ දී හා ඒවා සාක්ෂාත් කරගැනීමේ දී මුලින් සැලසුම් කරන ලද මූලික ප්‍රතිපත්තිවලින් යම්තාක් දුරට වෙනසක් දක්නට විය. මෑතකාලීන ව 1998 දී ඇති කරන ලද ප්‍රතිපත්තිමය විසඳුම් 1980 තරම් අතීත කාලයේ දී පැවැති ප්‍රතිපත්ති සිහි ගන්වන්නක් වූ අතර, ඒවා අසාර්ථක මෙන් ම අධික පිරිවැයක් වැය කරන කාර්යයක් විය. මෙම විසඳුම් හැර රජය විසින් තීරණය කරන ලද මිල ගණන් මුල් කරගෙන නැවත ගොවිපොළ මට්ටමේ ඒකාධිකාරී මිලදී ගැනීම් තත්ත්වයක් ඇති කිරීම, රජය විසින් තීරණය කරන ලද මිල මට්ටම්වලට වඩා අඩුවෙන් ධාන්‍ය මිල දී ගැනීම හා අලෙවි කිරීම, මිල ස්ථායීකරණය හා ආරක්ෂිත තොග පාලනයේ දී වාණිජමය අරමුණු හා ප්‍රතිපත්තිමය කාර්යය ඉතා පැහැදිලි ව වෙන් කිරීම මිල ස්ථායීකරණයේ දී හා ආරක්ෂිත තොග පාලනයේ දී මධ්‍යම හා පළාත් ආණ්ඩු අතර අරමුණු හා ප්‍රතිපත්ති හා වගකීම් ඉතා පැහැදිලි

ව වෙන් කිරීම ද වැදගත් ය. නව ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම මූල්‍ය හා භෞතික ගබඩා කිරීමේ ධාරිතාවයන් අනුව ධාන්‍ය මිලදී ගැනීමේ වැඩසටහන් මුළුමණින් ම අසාර්ථක විය.

තව ද, චීනයේ එළවළු පලතුරු හා සත්ව නිෂ්පාදනය ද වෙළෙඳපොළ නිර්බාධකරණය හේතු කොටගෙන පසුගිය දශක කිහිපය තුළ ඉතාමත් දියුණු හා සංවර්ධන තත්ත්වයට පත්විය. එසේ වුවත්, ප්‍රතිපත්තිමය ගැටළු කීපයක් හා ආයතනික සංරෝධයන් කීපයක් හේතු කොටගෙන අලෙවිකරණ කාර්යක්‍ෂමතාවය පහත් මට්ටමකට පත්ව ඇත. ජාතික නිරෝධායන කටයුතු සඳහා ප්‍රමිතීන් හඳුන්වාදීම, නිෂ්පාදන ප්‍රමිතීන් හඳුන්වාදීම, පළාත් අතර භාණ්ඩ ප්‍රවාහන කටයුතු විධිමත් වීම ආදිය නිසා වෙළෙඳපොළ කාර්යක්‍ෂම වූ අතර, ගොවීන්ගේ ආදයම වර්ධනය විය. නිෂ්පාදිත භාණ්ඩ ප්‍රවාහනයේ දී ජාතික ප්‍රමිතීන් සම්පූර්ණ කළ යුතු අතර, එමගින් පළාත් අතර නීතිමය ආකාරයට භාණ්ඩ හුවමාරු කිරීම නිල වශයෙන් කළ හැකි විය. පහළ මට්ටමේ ගොවීන්ගේ මිල දී ගැනීමේ තත්ත්වයන් වර්ධනය කිරීමේ දී ඔවුන් සතු කේවල් කිරීමේ හැකියාව වර්ධනය වී ඇත. වෙළෙඳ සංවිධාන මගින් කරන ලද ආයතනික සංවර්ධනය මේ සඳහා දයක වී ඇති අතර එමගින් ගොවීන්ගේ ආදයමද වැඩි වී ඇත. දනට චීනයේ ග්‍රාමීය අංශය තුළ ගොවි සංවිධාන කීපයක් සංවර්ධනය වී ඇත. නමුත් මෙම සංවිධාන මූලික වශයෙන් තම අවධානය යොමු කරන්නේ, කෘෂි භාණ්ඩ නිෂ්පාදනයට මිස අලෙවිකරණය සඳහා නොවේ. එබැවින් මේ සඳහා නීතිමය පද්ධතියක් හඳුන්වාදීමෙන් ද නව පාලන ක්ෂේත්‍රයක් ඉදිරිපත් කිරීමෙන් ද පවතින ගැටළු නිරාකරණය කිරීමෙන් ද රජය මෙම ගොවි සංවිධාන සඳහා ආධාර උපකාර කළ යුතු ය. තහනම් නීති පද්ධතීන් මේ සඳහා ප්‍රමාණවත් නො වන අතර එම නීතිරීති හා ආයතනික පද්ධතියක් පිහිටුවීමට ඔවුන් ධෛර්යමත් කළ යුතු ව ඇත. එමෙන් ම ගොවීන්ට මේ සඳහා තාක්‍ෂණික දැනුම, කළමනාකරණය හා පුහුණුවීම් අවශ්‍ය වන බැවින් විශේෂඥ දැනුම් හා නව සංවිධානයක අවශ්‍යතාවයන් කැපී පෙනේ. එබැවින් වෙළෙඳපොළ දැනුම හා තොරතුරු ලබා ගැනීමේ තාක්‍ෂණික නිපුණතාවයන්ගෙන් පරිපූර්ණ වූ වැඩසටහන් හා ව්‍යාපෘති ඇතිවිය යුතු ය. අලෙවිකරණ සංවිධාන නොමැතිවීමෙන් බොහෝ විට ගොවීන් වෙළඳපොළ සූරා කෑමට භාජනය වන අතර, කුඩා ගොවිපොළ ක්‍රියාකාරීත්වය අකර්මන්‍යය වීමෙන් සැපයුමේ හිඟයක් තැනින් තැන විසිරී ඇති වෙළෙඳපොළ තුළ ඇති විය හැකි ය (Zhang, 2001).

රජය විසින් තනි සංවිධානයක් පිහිටුවා එමගින් වෙළෙඳපොළ තොරතුරු එකතු කර, බෙදා හැරීමෙන් ද, ක්‍රමවත් තොරතුරු ලබා ගැනීමේ පද්ධතියක් පිහිටුවීමෙන් ද මේ සඳහා දයක විය හැකි ය. නිවැරදි හා ප්‍රමාණවත් තොරතුරු ලබාදීමෙන් වෙළෙඳපොළ සහතික කරලීමේ පද්ධතියක් පිහිටුවීමෙන් ද, මේ සඳහා රජයට දයක විය හැකි ය. නිවැරදි හා ප්‍රමාණවත් තොරතුරු ලබාදීමෙන් වෙළෙඳපොළ සහතික කරලීමට චීන මධ්‍යම වෙළෙඳපොළ තොරතුරු ආයතනයට හැකිවන අතර, එමගින් ලෝක ජනගහනයෙන් සියයට 20ක් වූ පමණ ප්‍රමාණයක් සඳහා වූ තම තොග වෙළෙඳපොළ විධිමත් කර ගැනීමට චීනයට හැකි ය (Zhang, 2001).

## 12. දරිද්‍රතාවය තුරන්කරලීම

මුල්කාලීන ආර්ථික ප්‍රතිසංස්කරණ අවධියේ දී ඇති කරගන්නා ලද වේගවත් ආර්ථික වර්ධනය, ග්‍රාමීය දරිද්‍රතාවය සීඝ්‍රයෙන් අඩු කිරීමෙ හි ලා මහත් සේ දයක වී ඇත. මෙම ජයග්‍රහණය ඇති වූයේ, ග්‍රාමීය කෘෂි ශ්‍රමය වෙරළබඩ කලාපවලට සංක්‍රමණය වීමත්, නව රැකියාවන් උත්පාදනයත් හේතු කොටගෙන ය. කෙසේ වුව ද තවමත්. දශ ලක්ෂ 50ක ජනතාව ජාතික දරිද්‍රතා මට්ටමේ නිල රේඛාවට පහළින් සිටින අතර, ඔවුහු බොහෝ දුෂ්කර හා කටුක ප්‍රදේශවල ජීවත් වෙති. එමෙන් ම ඉතාමත් පහළ අඩු සම්පත් ප්‍රමාණයකට හිමිකම් කියන අතර, කෘෂිකාර්මික නිෂ්පාදනය වැඩි කිරීමේ සීමාසහිත හැකියාවකින් ද, යුතු වෙති (World Bank, 1999). ඉතා ඉහළ වැටුප් අනුපාත, දුප්පත්, ග්‍රාමීය ප්‍රදේශවලින් සංවර්ධිත නාගරික ප්‍රදේශ කරා ශ්‍රමිකයන් විශාල ප්‍රමාණයක් සංක්‍රමණය සඳහා මනා දිරිගැන්වීමක් වී ඇති අතර, එය දරිද්‍රතාවය දුරලීමේ මාර්ගයක් වශයෙන් විද්‍යමාන වේ. මෙම ග්‍රාමීය දරිද්‍රතාවය තුරන් කරලීම සඳහා කෘෂිකාර්මික නො වන රැකියා අවස්ථාවන් වැඩි දියුණු කළ යුතු ය. එමෙන් ම එම අවස්ථාවන් අනෙකුත් ජාතික ආර්ථික කටයුතු සමග ඒකාබද්ධ කළ යුතු ය. මනා ලෙස සැකසුම් කරන ලද අධ්‍යාපන ක්‍රම මගින් ශ්‍රමය සඳහා හොඳ වෙළෙඳපොළක් ඇති කළ යුතු අතර, එය ග්‍රාමීය දරිද්‍රතාවය තුරන්කරලීමේ එක් ප්‍රධාන උපාය මාර්ගයක් වනු ඇත.

දරිද්‍රතාවය තුරන්කරලීමේ වැඩසටහන් කාර්යක්ෂම කිරීමේ දී ඒවා ඉතා සැලසුම්ගත වැඩසටහන් විය යුතු අතර පූර්ණ වශයෙන් දරිද්‍රතාවයෙන් පෙළෙන ගෘහස්ථ ඒකකයන් ඉලක්ක කර ගත යුතු ය. මෙය දුප්පත් රටවල් සඳහා ඉතා වැදගත් කාරණයක් වන අතර, ඒ සඳහා එම රටවල උප පරිපාලන ඒකකයන් සහභාගී කර ගත හැකි ය. දරිද්‍රතාවය තුරන් කරලීමේ ඇතැම් ඉලක්ක සාර්ථක ව සිදු වූ බව චීනයේ ඇතැම් පළාත්වල මෑතකාලීන ව ක්‍රියාත්මක කළ සංවර්ධන වැඩසටහන්වලින් මනාව පෙනී යන අතර, ඇතැම් පළාත්වලදී එහි අසාර්ථකභාවයන් ද පෙන්නුම් කර ඇත. දරිද්‍රතාවය තුරන් කරලීමේ වැඩසටහන් සැලසුම් කිරීමේ දී හා ක්‍රියාත්මක කිරීමේ දී ප්‍රදේශීය ආණ්ඩු හා එහි නායකයන් උපදේශකත්වයෙ හි ලා සැලකිය යුතු අතර, එම සැලසුම් සඳහා ඔවුන්ගේ සහභාගීත්වය ද ඉතා වැදගත් වේ. ප්‍රජා සහභාගීත්වය, දරිද්‍රතාවය තුරන්කරලීමෙ හි ලා කරන වැඩසටහන්වල ඒකාබද්ධ මූලධර්මයක් වන නිසා මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී ඒ සඳහා වැඩි අවධානයක් යොමු කළ යුතු ව ඇත. මෙම වැඩසටහන්වල වැඩි අවධානයක් යොමු කරන්නේ ඒ සඳහා යොදවන සම්පත් හා වැඩසටහන්වල බලපෑම්, පිළිබඳ කරන පසු ඇගයීමේ කටයුතුවලට ය. "වැඩ සඳහා ආහාර (food for work)" යන තේමා පාඨය මුල් කරගත් දරිද්‍රතාවය තුරන් කරලීමේ ව්‍යාපෘති සාමාන්‍යයෙන් සාර්ථක වී ඇත (World Bank, 1999). මෙම ක්‍රමයේ දී සාමාන්‍ය මූල්‍ය ක්‍රමය අභිබවා කටයුතු කරන අතර, එමගින් මෙම ව්‍යාපෘති ඉතා ලසු ආකාරයට නිර්වචනය කර ඇත. කෙසේ වුව ද මෙම ව්‍යාපෘති පහසුවෙන් නඩත්තු කළ හැකි අතර, ඉතා ඉහළ ආකර්ශනීය ආයෝජන ප්‍රතිලාභ ලබා ගෙන ඇත. කෘෂිකාර්මික ආයෝජන, ග්‍රාමීය කර්මාන්ත ව්‍යාපාර මාර්ග හා අනෙකුත් ග්‍රාමීය පාදක ව්‍යුහමය සංවර්ධන කටයුතු

නිසා දුප්පතුන්ගේ ආදයම මෙන් ම ඵලදායීතාවය වැඩි වී ඇත. කෙසේ වෙතත් පවතින සම්පත්වල හිඟකම මගින් බොහෝ දුප්පත් ප්‍රදේශවල පාදක ව්‍යුහමය ආයෝජනවල ඇති කාර්යක්ෂමතාවය සීමා කර ඇත. ආයෝජන ප්‍රතිලාභ එතරම් හිතකර නො වන බැවින් ද එහි ප්‍රතිලාභ අනුපාත ඉතා පහළ මට්ටමක පවතින හෙයින් ද දරිද්‍රතාවය තුරන් කරලීමේ වැඩසටහන් නැවත සලකා බැලිය යුතු තත්ත්වයකට පත් ව ඇත.

සීඝ්‍ර ආර්ථික වර්ධන වේගය ඉතාමත් පැහැදිලි ව දරිද්‍රතාවය අඩු කිරීම කෙරේ බලපාන හෙයින් දරිද්‍රතාවය අඩු කිරීමේ වැඩසටහන් මගින් ඇතැම් විට මිශ්‍ර ප්‍රතිඵල ද ලැබී ඇත. දුප්පත්කම අඩුකිරීමේ වැඩසටහන් මගින් දිගුකාලීන ආර්ථික වර්ධනයට දයක වුව ද එම වැඩසටහන් කාර්යක්ෂමතා නිර්නායක මූලධර්ම හා ආයෝජන ප්‍රතිලාභ මත පදනම් විය යුතු ය. දරිද්‍රතාවය තුරන් කරලීමේ සහනාධාර සහිත ග්‍රාමීය ණය වැඩසටහන් දුප්පතුන් කරා ළඟා වී නොමැත. මේ නිසා අඩු පොලී සහිත ණය ගෙවීමේ අනුපාත නැවත සකස් විය යුතු අතර, මූල්‍ය පහසුකම් ලැබිය යුත්තේ ග්‍රාමීය ගෘහස්ථ ඒකකවලට ය. සමහර ප්‍රදේශවල පහළ මට්ටමේ (grass roots) සූක්ෂම-මූල්‍ය සැලසුම් මගින් දරිද්‍රතාවය අඩු කර ගත හැකි බවට පෙනී ගොස් ඇති හෙයින්, ඒ සඳහා වැය වන ගනුදෙනු පිරිවැය (transactions costs) අඩු කර ගත හැකි වී තිබේ. මෙම පිරිවැය වැය වන්නේ අවශ්‍ය ණය ව්‍යාපෘති ඇගයීම, ණය නිකුත් කිරීම, ණය මුදල් ඇගයීම, ණය නැවත අය කර ගැනීම ආදී කාර්යයන් සඳහා ය. දරිද්‍රතාවය තුරන් කරලීමේ වැඩසටහන්වල දී මෙම ක්‍රමය යටතේ බොහෝ ණය දීමේ ව්‍යාපෘති සාර්ථක වී ඇත (World Bank, 1999). මෙවැනි වැඩසටහන් ඉතා ප්‍රවේශම්කාරී අයුරින් සැලසුම් කළ යුතු ය. මේ සඳහා අවශ්‍ය ශ්‍රම සම්පත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ ඒවායේ බලපෑම් ඇගයීමට ලක් කිරීම ආදිය සැලසුම් සහගත අයුරින් ඉටු කළ යුතු ව ඇත. එමෙන් ම මෙම ග්‍රාමීය ණය ප්‍රතිපත්තීන් වඩා නම්‍යශීලි විය යුතු අතර, විශේෂයෙන් ම ණය පොලී අනුපාත වඩාත් වැදගත් වේ. එය මෙම වැඩසටහන්වල තිරසාරභාවය තීරණය කරන කාරණයක් ද වනු ඇත.

## 13. ස්වභාවික සම්පත් සහ ග්‍රාමීය පරිසර විනාශය

ග්‍රාමීය පරිසරය තුළ ස්වභාවික සම්පත් අපහරණයට ලක්වීම හා පරිසර දූෂණය ඉතා දැඩි අවධානයට යොමු විය යුතු කාරණා ය. ඇතැම් කෙටි ප්‍රවෘත්ති වාර්තා සහ ප්‍රමාණාත්මක පරිසර අධ්‍යයන වාර්තා මගින් පෙන්වා දෙන්නේ පරිසර දූෂණය හා පාංශු සෝදා පාළුව අඛණ්ඩ ව චීනයේ බොහෝ ප්‍රදේශවල සිදු වන බව යි. යැංකිසියැං ගංගාව ආශ්‍රිත ව 1998 ඇති වූ මහා ජල ගැල්ම මගින් ඉතා දරුණු පරිසර හානියක් සිදු කර තිබිණි. කෙසේ වෙතත්, ප්‍රමාණාත්මක පරිසර ඇගයීම් මගින් සිදු කර ඇති ස්වභාවික සම්පත් හා පරිසර ගැටළුවල ව්‍යාප්තිය දැඩි අවධානයට ලක් වී ඇත. නිරන්තරයෙන් ම වනාන්තර එළිපෙහෙළි කිරීම හා තෘණ හා ආරක්ෂිත ප්‍රදේශ වගා කටයුතු සඳහා එළිපෙහෙළි කිරීම 1950 සහ 1960 ගණන්වල සිට ම ප්‍රධාන පරිසර ගැටළු බවට පත් වී ඇත. එසේ වුවත් එම තත්ත්වය 1980 සහ 1990 ගණන් වන විට වෙනස් මුහුණුවරක් ගෙන තිබිණි.

පරිසරය විනාශ වී යෑමේ තර්ජනයන් විවිධාකාර වූ ස්වරූප ගෙන ඇත. සංඛ්‍යා ලේඛන වාර්තාවන්ට අනුව වනාන්තර ඝනත්වය වර්ධනය වී ඇති අතර යැංකිසියැං ගංගාධාර ප්‍රදේශයේ රොන්මඩ තැන්පත් වීම, පරිසර ගැටළු විශාල ප්‍රමාණයක් නිර්මාණය කරන්නක් වී ඇත. මෙම ගංගාධාරයේ පහළ කොටසේ රොන්මඩ තැන්පත්වීම සියයට 25 කින් පමණ වැඩි වී යෑමෙන් ඉහළ ප්‍රදේශවල පරිසරය විනාශ වීමේ තර්ජනය තව තවත් බරපතල වී ඇත (World Bank, 1999). කෙසේ වෙතත් සියලු ම ප්‍රධාන ගංගාවල ජලය දූෂණයට ලක් වීම දිගින් දිගට ම සිදු වී ඇති අතර බොහෝ වෙරළබඩ තෙත් බිම්වල ජලය ගලා යෑමට පටන් ගෙන ඒවා වියළි බිම් බවට පත්වීමේ ප්‍රවණතාවය වැඩිවෙමින් පවතී.

එසේ ම ආර්ථික වර්ධනය හා පරිසරය විනාශ වීමෙන් සිදුවන බලපෑම් පිළිබඳ විස්තර කිරීම් හා විග්‍රහ කිරීම් අතර සම්බන්ධතාවයන් ගැටෙන සුළු ය. විවිධාකාර වූ තක්සේරු වාර්තාවන්ට අනුකූල ව පරිසර විනාශ වීමේ අගය දළ ජාතික නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 0 සිට 15 දක්වා වෙනස්වන බව දක්වා තිබේ (Wang, *et al*, 2000). නමුත් මෙම ඉහළ වටිනාකම තක්සේරු කර ඇත්තේ ඇතැම් උපකල්පනයන් මත බැවින් ඒවායේ විශ්වසනීයත්වය පිළිබඳ යම් යම් ගැටළු ඇති වී තිබේ. ඉතාමත් සංකීර්ණ හා විෂය බද්ධ අධ්‍යයන මගින් පෙන්වා දී ඇත්තේ සහ තක්සේරු කර ඇත්තේ මෙම පරිසර විනාශයේ ආර්ථික පිරිවැය හෝ මූල්‍ය වටිනාකම දළ ජාතික නිෂ්පාදිතයේ මුළු වටිනාකමෙන් සියයට 7ක් පමණ වන බව ය (World Bank, 1999). කෙසේ වෙතත්, මෙම විනාශවීමේ පිරිවැය අඩු කිරීමට හෝ වැළැක්වීමට අවශ්‍ය විධිවිධානයන් පිළිබඳ මෙතෙක් නිවැරදි විග්‍රහයන් කිසිවක් ඉදිරිපත් කර නැත. පරිසර දූෂණ වැළැක්වෙන හා අවම වූ ආර්ථික වශයෙන් ඉතාමත් කාර්යක්ෂම හා සමාජීය බලපෑම් අවම වූ විසඳුම් සෙවීම සඳහා වඩා නිවැරදි තොරතුරු අවශ්‍ය වනු ඇත. පරිසරය විනාශ වී යෑමේ තර්ජනය අවම කිරීම ප්‍රමාණාත්මක ව තීරණය කිරීම ස්වභාවික ව සිදු වනු ඇත. ස්වභාවික සම්පත් විනාශ වී යෑමේ වර්ධන වේගය හා එයින් වන තර්ජනය, පරිසර දූෂණය සහ ඒවායින් වන බලපෑම සඳහා ප්‍රමාණාත්මක විශ්ලේෂණය සහ මෙම තර්ජනයන් වැළැක්වීම සඳහා යොදන ප්‍රතිකාර සහ විසඳුම් පිළිබඳ වාසි පිරිවැය විශ්ලේෂණය ද ස්වභාවික සම්පත් පිළිබඳ ප්‍රතිපත්ති මාලාවක අත්‍යවශ්‍යයෙන් ම තිබිය යුතු අංගයන් වනු ඇත.

පරිසර දූෂණයට හා පරිසර විනාශයට බලපානු ලබන ප්‍රධාන සාධක කිහිපයකි. ස්වභාවික සම්පත් ආරක්ෂාවට හා සංරක්ෂණයට අවශ්‍ය නීතිමය පද්ධතියක් ඇතත්, රාජ්‍ය මූල්‍ය පද්ධතිය මගින් නිරතුරු ව මේ සඳහා ලබා දෙන්නේ ප්‍රමාණවත් නො වන මූල්‍ය සම්පත් ප්‍රමාණයකි. එහි ප්‍රතිඵලයක් ලෙස ස්වභාවික සම්පත් සංරක්ෂණය හා ආරක්ෂා කරන ආයතන විසින් මෙම ස්වභාවික සම්පත් ආදායම් ඉපැයීමේ මාර්ග ලෙස භාවිතා කිරීමට උනන්දු වන අතර, එමගින් ඔවුන්ගේ වැටුප් ඇතුළු ව අනෙකුත් පුනරාවර්ථන වියදම් පියවා ගැනීමට උත්සුක වී ඇත. මෙම ආදායම් ජනනය කිරීමේ විධික්‍රම මගින් නැවත වතාවක් ස්වභාවික සම්පත් අනිසි පරිහරණය සඳහා යොදා ගන්නා බැවින් එය තවදුරටත් ස්වභාවික පරිසරය විනාශ කිරීමට හේතු සාධක වී ඇත. පරිසර ආරක්ෂාව හා සංරක්ෂණයට අවශ්‍ය මූල්‍ය සම්පත්

ලබාදීම, ජෛව විවිධත්වය ආරක්‍ෂා කිරීම හා නඩත්තු කිරීම ස්වභාවික සම්පත් ආරක්‍ෂාව සඳහා තිරසාර කළමනාකරණ පද්ධතියක් ලබාදීම හා ක්‍රියාත්මක කිරීම ආදිය පූර්ණ වශයෙන් රාජ්‍ය මූල්‍ය අනුග්‍රහයන් මගින් සිදුවිය යුතු බවට දැන් පිළිගෙන ඇත.

ග්‍රාමීය දරිද්‍රතාවය ද, පරිසරය විනාශ වී යෑමට ප්‍රබල ලෙස දයක වන වැදගත් සාධකයකි. දුප්පතුන් අනාගතයට වඩා වර්තමානය කෙරේ දැඩි අවධානයක් යොමු කරයි. මෙහි ප්‍රතිඵලයක් ලෙස ග්‍රාමීය දරිද්‍රතාවයෙන් පෙළෙන ජන කොටස් බොහෝ විට කඳු බෑවුම්වල වනාන්තර හෙළි කර, එම ඉඩම් යැපුම් වගා කටයුතු සඳහා යොදා ගැනීමත්, ඉන්ධන අවශ්‍යතාවයන් සඳහා වනාන්තරවල දැව යොදා ගැනීමත් වැනි කාර්යයන් හේතු කොටගෙන ස්වභාවික සම්පත් නිරන්තරයෙන් ම විනාශයට භාජනය වී තිබේ. මේ නිසා නැවත වනාන්තර වගා කිරීමෙන් පාංශු සෝදා පාළුව වැළැක්වීමටත්, වගා ශිල්ප ක්‍රම වැඩි දියුණු කිරීමටත්, කෘෂිකාර්මික කටයුතු වඩාත් කාර්යක්‍ෂම කිරීමටත් විවිධ ව්‍යාපෘතීන් මගින් දැඩි උත්සාහයක් ගෙන ඇත. මෙයට සමාන ව වනාන්තර නැවත වගා කිරීමටත්, ඒවා සංරක්‍ෂණය කිරීමටත් ඒ ආශ්‍රිත නිෂ්පාදන කාර්යක්‍ෂම කිරීමටත් නව ආයෝජනවල අවශ්‍යතාවයක් පවතී.

## 14. නිගමන

වර්ෂ 2030 වන විට චීන කෘෂිකර්ම ප්‍රතිපත්ති සඳහා වූ මධ්‍යස්ථානයේ (Centre for Chinese Agricultural Policy) පුරෝකථන අධ්‍යයන වාර්තාවන් අනුව, චීනයේ ආහාර සඳහා ඇති ඉල්ලුම සියයට 40 කින් පමණ ඉහළ යනු ඇත. එහෙයින් ආහාර සඳහා ඇති සැපයුම සියයට 40 කින් වැඩි කළ යුතු ව ඇත. ඒ අනුව, මෙහි මූලික අර්ථය නම්, රජය විසින් කෘෂිකර්මයේ අඛණ්ඩ වර්ධනය තව තවත් දිරිමත් කළ යුතු අතර දැනට පවත්වාගෙන යන ඉහළ ආර්ථික වර්ධන වේගය මේ ආකාරයෙන් ම පවත්වාගෙන යෑමට කටයුතු යෙදිය යුතු බව ය. එබැවින් මෙම අභියෝගයන් පහත සඳහන් සංවර්ධන ගැටළු සමග අනුගත වී ඇත.

වගා කළ හැකි ඉඩම් කට්ටිවල ප්‍රමාණය ඉතා සීඝ්‍රයෙන් අඩුවෙමින් තිබේ. 1995 දී ඒක පුද්ගල වගා කළ හැකි ඉඩම් ප්‍රමාණය වූ හෙක්ටයාර් 0.08 2030 වන විට හෙක්ටයාර් 0.05 දක්වා අඩු වී යෑමේ උපනතියක් ඇති වන බව කෘෂි විද්‍යාඥයින් දැනටමත් පුරෝකථනය කර ඇත.

වගා කටයුතු සඳහා 'ජල හිඟය' වඩාත් කැපී පෙනෙන ජාතික මට්ටමේ සංරෝධකයක් වී ඇත. චීන කෘෂිකර්ම ප්‍රතිපත්ති සඳහා වූ මධ්‍යස්ථානයේ පර්යේෂණ වාර්තාවන්ට අනුකූල ව, චීනයේ නොගැඹුරු මතුපිට භූගත ජල මට්ටම ඉතා සීඝ්‍රයෙන් පහත වැටෙමින් පවතී. මෙම තත්ත්වය ගැඹුරු භූ ගත ජල මට්ටම සම්බන්ධයෙන් ද සත්‍යයක් වී ඇත. චීනයේ ප්‍රයාන්ග් ගංගා ද්‍රෝනියේ (Fuyang River Basin) ජල මට්ටම පහළ යාම 1980-1998 අතර කාලයේ වර්ෂයකට මීටර් 02 කටත් වඩා වැඩි වී ඇත.

ධාන්‍ය නිෂ්පාදනය සඳහා පවතින අඩු සාපේක්ෂ වාසි පිරිවැය (limited comparative advantages) චීන ආර්ථික සංවර්ධනයේ දී මතුවන ප්‍රබල ගැටළුවකි. චීනය තිරිඟු, සහල් හා අනෙකුත් ධාන්‍ය විශාල වශයෙන් නිෂ්පාදනය කර අපනයනය කළ ද පවතින ජාත්‍යන්තර වෙළෙඳ රටාව තුළ මේ සම්බන්ධයෙන් චීනයට ඇත්තේ අඩු සාපේක්ෂ වාසි ප්‍රමාණයකි.

ආදායම් ව්‍යාප්තියේ විෂමතාවය සීඝ්‍රයෙන් වැඩි වෙමින් තිබේ. මෙය පසුගිය වසරවල (1998) 'ගිනි සංගුණකයේ' හැසිරීම මගින් නිරූපණය වේ (World Bank, 1999). වර්ෂ 1978 දී පැවති ගිනි සංගුණකයේ අගය වූයේ 0.2 කි. එය 1995 වන විට 0.35 දක්වා වැඩි වී ඇත.

වර්ෂ 2000 දී චීනය 'ලෝක වෙළෙඳ සංවිධානයට (World Trade Organization) ඇතුළත් වෙමින් සිය සාමාජිකත්වය තහවුරු කිරීම දැවැන්ත අභියෝගයක් වන අතර, අතිවිශාල ගැටළු සම්භාරයක් උදකර දෙන්නක් විය. මෙය දනටමත් චීනයේ මහත් මතභේදයට හා වාද විවාදයන්ට තුඩු දී ඇති කාරණයකි.

ආර්ථික සංවර්ධනයේ ප්‍රධාන ම හා මූලික යාන්ත්‍රණය ලෙසත්, දරිද්‍රතාවය තුරන් කරලීමේ ප්‍රධාන බලවේගය ලෙසත්, කෘෂිකාර්මික තාක්ෂණය (agriculrural tech nology) මගින් කෙරෙන කාර්යභාරය හා එහි වැදගත්කමත්, අවිවාදයෙන් පිළිගත් සිද්ධාන්තයකි. එහෙයින් ඉතාමත් සංවිධානාත්මක හා ශක්තිමත් කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතියක් චීනයේ පවතින අතර, එමගින් හඳුන්වා දුන් නව තාක්ෂණික ක්‍රමවේදයන් දශ ලක්ෂ ගණනින් යුතු චීන ගොවි ජනතාව විසින් අනුගමනය කෙරේ. එමගින් චීනය, ලෝකයේ අධිකතම ජන සංඛ්‍යාවක් වෙසෙන තම රටට මෙන් ම අනෙකුත් බොහෝ රටවල ජනතාවට අවශ්‍ය ආහාර ද සපයනු ඇත. ඔවුන්ගේ ආහාර අවශ්‍යතාවයන්ගේ සැපයුම සම්පූර්ණ කරනු ඇත. එබැවින් මුල් අවධියේ කරන ලද බොහෝ පර්යේෂණ අධ්‍යයන මගින් පෙන්නුම් කර දෙනු ලබන්නේ, පර්යේෂණ මුල් කොටගත් තාක්ෂණික හඳුන්වාදීම් සහ වෙනස් කිරීම් මගින් කෘෂිකර්ම වර්ධනයට අවශ්‍ය මූලික යාන්ත්‍රණය සපයා දුන් බව යි. 1980 - 1990 ත් අතර කාලයේ දී චීනයේ කෘෂිකාර්මික ඵලදායිතාවය (total factor productivity) භෝග නිෂ්පාදන අංශයේ දී ඉතා සීඝ්‍රයෙන් වර්ධනය වූ අතර, ඒ සඳහා මූලික වශයෙන් හේතු වූයේ, චීනයේ කෘෂිකාර්මික පද්ධතිය මගින් හඳුන්වාදුන් තාක්ෂණික ක්‍රමවේදය යි. මෙවැනි සාර්ථක අධ්‍යයන අත්දැකීම් තිබියදීත් අද චීනය සැලකිය යුතු ප්‍රමාණයක අභියෝගයන්ට මුහුණ දෙමින් සිටී. කෘෂිකර්ම පර්යේෂණ සඳහා මෑතකාලීන ව සිදු වූ මූල්‍ය ප්‍රතිපාදන අඩුවීමේ භයානකකම ඉතා තදින් ම කාර්මික ආයෝජන මට්ටම, තීරණය කිරීම හෝ අඩුවීම කෙරේ බලපා ඇත. මෙයට අමතර ව මෙම පර්යේෂණ පද්ධතිය තුළ දක්නට ලැබෙන අකාර්යක්ෂමතාවය, අනවශ්‍ය පර්යේෂණ හා තාක්ෂණික මෙවලම් සඳහා ඇතැම්විට අනවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලැබීම, එක ම වැඩසටහන් දෙවරක් ක්‍රියාත්මක වීම වැනි මූලික දුර්වලතාවයන් කීපයක් නිසා නව ප්‍රතිසංස්කරණයක අවශ්‍යතාවය කැපී පෙනේ.

මෙම අභියෝගයන්ට අමතර ව, චීනය ජාත්‍යන්තර වෙළඳ සංවිධානයට ඇතුළත් වීම හා බැඳුණු සංවර්ධන විභවතාවය ඉමහත් ය. මේ නිසා චීන රජය විසින් ඉතා විශාල සංවර්ධන ප්‍රයත්නයක් දැරිය යුතු ව ඇත. බොහෝ පර්යේෂණ අධ්‍යයන මගින් පෙන්වා දෙනු ලබන්නේ ජාතික හා සමස්ත සංවර්ධනය වෙනුවෙන් 'රාජ්‍ය ආයෝජන' මගින් ඉතා විශාල කාර්යභාරයක් කළ යුතු බව යි. මෙම කරුණු විශේෂයෙන් ම කෘෂිකර්මය හා බැඳුණු පර්යේෂණ, සංවර්ධන සහ ග්‍රාමීය අධ්‍යාපනය සම්බන්ධයෙන් ඉතාමත් වැදගත් වේ. මේ සම්බන්ධ ව පැණ නැගී ඇති මූලික ගැටළු දෙකකි.

1. ආයෝජන අවස්ථාවන්ගේ වැදගත්කම හා අවශ්‍යතාවන් අනුව එහි ප්‍රමුඛතාවයන් හඳුනා ගන්නේ කෙසේ ද?

2. කෘෂිකාර්මික පර්යේෂණ, සංවර්ධනය හා ග්‍රාමීය අධ්‍යාපනය වැඩිදියුණු කරමින් එය සංවර්ධනය කළ යුත්තේ කෙසේ ද? යන්නයි.

එමෙන් ම මෙයට අමතර ව චීන කෘෂිකර්මය හා ග්‍රාම සංවර්ධනය පිළිබඳ කෙරී ඇති විවිධ පර්යේෂණ අධ්‍යයන වාර්තාවන්ගෙන් පෙන්නුම් කරන්නේ ද, චීනයට තම ධාන්‍ය නිෂ්පාදනය සඳහා ලෝක වෙළෙඳපොළේ සාපේක්ෂ වාසි-පිරිවැයක් නොමැති බවත්, එම ධාන්‍ය නිෂ්පාදනය මුළුමණින් ම පාහේ 'ඉඩම් සූක්ෂම' (land intensive commodity) භාණ්ඩයක් බව ය. එසේ ම චීනයේ නිෂ්පාදිත අනෙකුත් කෘෂි නිෂ්පාදනයන් 'ශ්‍රම සූක්ෂම' (labour intensive) භාණ්ඩයන් ලෙස වර්ග කරනු ලබන අතර සත්ව නිෂ්පාදනයන්, පලතුරු ඇතුළු අනෙකුත් අධ්‍යාන භෝග සහ ධීවර නිෂ්පාදනයන් මේ ගණයට අයත් වන බව ය. මේ සියලු ම අංශයන් සඳහා පවතින ඉහළ ම මට්මේ ගුණාංග සහ ප්‍රමිතීන් (quality and standards of products) පිළිබඳ ව ඇති තත්ත්වය යි.

මෙම සියලු ම සංරෝධකයන් හමුවේ අවසන් හෙවත් සමස්ත අභියෝගය වනුයේ, ආර්ථික වර්ධනය, ග්‍රාමීය දරිද්‍රතාවය සහ පරිසරය යන ත්‍රිත්ව ක්‍රියාකාරීත්වයන් සමස්ත ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය තුළ කුමන ආකාරයට එක් එක් සංසිද්ධීන් කැප කළ යුතු ද කුමන ආකාරයට හැසිරවිය යුතු ද එසේ නැතිනම් කෙසේ තුලනය කළ යුතු ද (Trade Offs) යන්න පිළිබඳ තීරණයන්ට එළැඹීම යි.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


1. Baker, R. and Sinha, R. (1982). The Chinese Agricultural Economy Boulder. West View Press, USA.

2. Chang, K. (1985). 'Perspectives on Development in Mainland China'. The West View Pelican Edition. West View Press, UK.

3. Chuanmin, S., Yisong, W., Yong, S., and Ming, L. (2000). The Manual for the Modern Agricultural Management: International Training Class (I). The Training Center of Agricultural Officials, Hubei – China.

4. Fan, S.L., Zhang and Zhang, X. (April 2002). 'Growth, Inequality, and Poverty in Rural China: the Role of Public Investments.' IFPRI Research Report No. 125. International Food Policy Research Institute.

5. FAO, (September 1995). The FAO Review: Ceres Published Bi-Monthly the FAO.

6. Gerald, M.M. and Rauch, J.E. (2000). Leading Issues in Economic Development. Oxford University Press, Oxford.

7. Government of China, (1998, 1999, 2000). China Facts & Figures. New Star Publishers, Beijing.

8. Hinton, H. C. (1981). The People's Republic of China: 1949-1979, A Documentary Survey. Council of Foreign Affairs, USA.

9. Huang, J. and Hu, R. (2000). 'Agricultural R&D Investment System and Pattern: Current Situation and International Comparison', Management World (Chinese), No.3 170-179.

10. Huang, J., Hu, R., Zhang, L., and Rozelle, S. (2000). The Economy of China's Agricultural R&D Investment. China Agricultural Press (Chinese), Beijing.

11. Huang, J. and Ma, H. (2000). 'A Comparison of Production Costs of Major Agricultural Products between China and the Main International Competitors,' Chinese Rural Economy , No. 5 (2000): 17-21.

12. Huang, J. and Ma, H. (2000). The 20-Years Return and the Role of Agriculture in China. Capital How from Rural to Urban and Farm Agriculture to Industry.

13. Huang, J. and Rozelle, (2002). The Nature of Distortions to Agricultural Incentives in China and Implications of WTO Accession. Paper presented at the second project meeting on WTO Accession and Poverty Reduction in China, Beijing.

14. Huang, J. and Rozelle, S. (2001). Trade Liberalization, WTO and China's Food Economy in the 21st Century: Larger, Modest, or Little Impacts.

15. Huang, Zu-Hui (1996). Family Farming: The Effective Government Structure in Agriculture, - On the Chinese Case Analysis Concerning

Organization and Transaction Cost Perspective. College of Economics and Trade, Zhejiang Agricultural University, Hangzhou.310029, P.R. China.

16. Short, P. (1982). The Dragon and the Bear: Inside China and Russia Today. Hodder and Stoughton, London, UK.

17. Wang, J., Huang, J., and Rozelle, S. (2000). 'An Innovation of Property Rights in the Groundwater Irrigation System and Its Theoretical Explanation'. Economic Research Journal (Chinese), No. 4 66-74.

18. Wang, N. (2003). Measuring Transaction Costs: An Incomplete survey, The University of Chicago, Illinois, USA.

19. World Bank, (1985). China: 'Long Term Development Issues and Options.' A World Bank Country Economic Report. Published for the World Bank. The Johns Hopkins University Press, London.

20. World Bank, (1999). 'Transport in China – An Evaluation of World Assistance,' Report No. 18865, Washington.

21. World Bank, (2000). China: Over coming Rural Poverty. Washington D.C., World Bank.

22. World Bank, (2001). World Development Report, Washington D.C., World Bank.

23. Yang Li – Ming, (March 1999). Rural Organization and Agricultural Production in China. The Ministry of Agriculture, People's Republic of China.

24. Yao, S. and Colman, D. (1990). Oxford Agrarian Studies, Vol.18, no.1.

25. Yongding, Y. (2001). China's Macro-economic Outlook: 2000-2001 World Economy & China, Number 1 Volume 1. China.

26. Zhang, L.X. (2000). Agricultural and Rural Development in China. Center for Chinese Agricultural Policy. Chinese Academy of Sciences, Beijing, China.

27. Zhang, L.X. (2003). Agricultural and Rural Development in China. Agricultural Development and Opportunities for Aquatic Resources Research in China. Penang, Malaysia.

28. Zhigang, Z. (April 1996). China's Economic Reform and International Development. Department of Economics, Gotebory University, Sweden.